# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත

[සහතිකය සටහන් කළේ 2008 දෙසැම්බර් මස 01 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2008 දෙසැම්බර් මස 5 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 35.00 යි. තැපැල් ගාස්තුව : රු. 15.00 යි.

# 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත

[සහතිකය සටහන් කළේ 2008 දෙසැම්බර් මස 01 වන දින]

එල්.ඩී.—ඕ. 34/2004.

ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ මහා මාර්ග පද්ධතියක් සැලසුම් කිරීම, සැලසුම් සකස් කිරීම, ඉදි කිරීම, සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම සඳහා ද ; මහා මාර්ග ඉදිකිරීම, සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා පෞද්ගලික ආයෝජනය ලබා ගැනීම පහසු කරවීමට අවශ්‍ය නීති පද්ධතියක් සකස් කිරීම සඳහා ද ; මාර්ග සංවර්ධනය සහ නඩත්තු කිරීම සඳහා පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා ද ; මාර්ග සහ මහා මාර්ග ඉදිකිරීමේ, නඩත්තු කිරීමේ සහ කළමනාකරණය කිරීමේ යෙදී සිටින ප්‍රජා මූල සංවිධාන දිරිමත් කිරීම සහ ඒවාට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා ද ; ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

සැලසුම් කිරීමේ, සැලසුම් සකස් කිරීමේ, ඉදිකිරීමේ, නඩත්තු කිරීමේ, සංවර්ධනය කිරීමේ සහ පරිපාලනය කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් වශයෙන් නවීකෘත ඒකාබද්ධ මහා මාර්ග පද්ධතියක් ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට සපුරාදීම සඳහා රජය බැඳී සිටින මහාමාර්ග සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්තියක් සම්පාදනය කර ඒ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය වන හෙයින් : පූර්විකාව.

ඒ සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

## I වන කොටස

### සාමාන්‍ය

2. මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත්ව, මේ පනත, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් පනත අදාළ වීම.

2—PL 003218—3,500 (2008/09)

නඩත්තු කරනු ලබන සහ පරිපාලනය කරනු ලබන මාර්ග හැර 4 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද සියලු මාර්ග සහ මහා මාර්ග මෙන්ම සියලු ජාතික මහා මාර්ගවලට අදාළ විය යුතු ය.

පනත පරිපාලනය කිරීම.

3. (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත, අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධාන සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට යටත්ව මේ පනතේ සඳහන් රජයේ දෙපාර්තමේන්තු හෝ ආයතන විමසා, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ පරිපාලනය කිරීමේ සුවිශේෂ බලය තිබිය යුතු ය.

(2) අධිකාරිය විසින් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී සහ පරිපාලනය කිරීමේ දී 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත මගින් පවරා ඇති සියලු හෝ යම් බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

මාර්ගයක් මහා මාර්ගයක් බවට ප්‍රකාශයට පත්කිරීම.

4. (1) ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් 8 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටුව විමසා අමාත්‍යවරයා විසින් මාර්ගයක්, මහා මාර්ගයක් ලෙසට ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව මහා මාර්ගයක් ලෙසට ප්‍රකාශයට පත් කර ඇති මහා මාර්ගයක්, මේ පනත ක්‍රියාත්මක වන දින සිට සහ ඉන්පසුව, මේ වගන්තියේ අර්ථානුකූලව මහා මාර්ගයක් බවට සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද සෑම මහා මාර්ගයක් ම අධිකාරිය වෙත සතු කළ යුතු අතර, ඒ අනුව සෑම මහා මාර්ගයක් ම අධිකාරිය විසින් පරිපාලනය කිරීම සහ නඩත්තු කරගෙන යාම කළ යුතු ය.

(3) මේ පනතේ කාර්ය සඳහා මහා මාර්ගයක් යන්නට ඇළ මාර්ගයක් හෝ ගංගාවක් ද ඇතුළත් වේ.

නිලධරයන්ගේ සහ සේවකයන්ගේ බලතල.

5. (1) අධිකාරියේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පළාත් අධ්‍යක්ෂවරයා, ප්‍රධාන ඉංජිනේරුවරයා සහ විධායක ඉංජිනේරුවරයා මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය කිරීම පිළිබඳව වග කියනු ලැබිය යුතු ය.

(2) (අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ පනත මගින් තමා වෙත පවරා ඇති කර්තව්‍ය, අවස්ථාවෝචිත පරිදි පළාත් අධ්‍යක්ෂවරයාට, ප්‍රධාන ඉංජිනේරුවරයාට, විධායක ඉංජිනේරුවරයාට, අධිකාරියේ යම් නිලධරයකුට හෝ යම් ප්‍රජා මූල සංවිධානයකට පවරා දෙනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය ;

(ආ) මේ පනත මගින් තමා වෙත පවරා ඇති කර්තව්‍ය, පළාත් අධ්‍යක්ෂවරයා විසින් අවස්ථාවෝචිත පරිදි ප්‍රධාන ඉංජිනේරුවරයාට හෝ විධායක ඉංජිනේරුවරයාට හෝ යම් ප්‍රජා මූල සංවිධානයකට පවරා දෙනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය ;

(ඇ) මේ පනත මගින් තමා වෙත පවරා ඇති කර්තව්‍ය, ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් අවස්ථාවෝචිත පරිදි විධායක ඉංජිනේරුවරයාට හෝ යම් ප්‍රජා මූල සංවිධානයකට පවරා දෙනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය ;

(ඈ) මේ පනත මගින්, තමා වෙත පවරා ඇති කර්තව්‍ය විධායක ඉංජිනේරුවරයා විසින් අවස්ථාවෝචිත පරිදි යම් ප්‍රජා මූල සංවිධානයකට පවරා දීම නීත්‍යනුකූල විය යුතු ය ;

(ඉ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවස්ථාවෝචිත පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා, පළාත් අධ්‍යක්ෂවරයා, ප්‍රධාන ඉංජිනේරුවරයා, විධායක ඉංජිනේරුවරයා හෝ ප්‍රජා මූල සංවිධාන වෙත මේ පනත මගින් පවරා ඇති යම් කර්තව්‍යයක්, ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් අධ්‍යක්ෂවරයා, ප්‍රධාන ඉංජිනේරුවරයා හෝ විධායක ඉංජිනේරුවරයා හෝ ප්‍රජා මූල සංවිධානයක් නොවන්නා වූ අධිකාරියේ වෙනත් යම් නිලධරයකු වෙත බලය ලබාදීම නීත්‍යනුකූල විය යුතු ය.

## II වන කොටස

## උපදේශක මණ්ඩල

මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව පිහිටුවීම.

6. (1) (මෙහි මින් මතු "උපදේශක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර, එම උපදේශක සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නිල බලයෙන් පත් වන සාමාජිකයන් එනම්—

(i) උපදේශක සභාවේ සභාපති විය යුතු මහා මාර්ග විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ii) කටුබැද්ද ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු අංශයේ ප්‍රධානියා විසින් නම් කරනු ලබන, මොරටුව ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශයේ නියෝජිතයකු ;

(iii) කර්මාන්ත ඉදිකිරීම් මණ්ඩල ආයතනය විසින් නම් කරනු ලබන එම ආයතනයේ නියෝජිතයකු ;

(iv) වාණිජ මණ්ඩලය විසින් නම් කරනු ලබන වාණිජ මණ්ඩලයේ නියෝජිතයකු ;

(v) 1968 අංක 17 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනය පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නම් කරනු ලබන එම ආයතනයේ නියෝජිතයකු ;

(vi) ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(vii) පොලිස්පතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ තත්ත්වයට පහළ නොවන නිලධරයකු ;

(viii) ඉඩම් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඉඩම් අමාත්‍යාංශයේ ඉඩම් පරිහරණය කිරීමේ ප්‍රතිපත්ති සැලසුම් අංශයේ සාමාජිකයකු ;

(ix) මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු ;

(x) කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(xi) සංචාරක විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සංචාරක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(xii) ප්‍රවාහන විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ප්‍රවාහන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(xiii) මිනුම්පතිවරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(xiv) 1986 අංක 23 දරන නගර සැලසුම්කරන්නන්ගේ ආයතනය විසින් නම් කරනු ලබන එම ආයතනයේ නියෝජිතයකු ; සහ

(xv) මෝටර් රථ වාහන කොමසාරිස් හෝ ඔහු විසින් නම් කරන සහකාර මෝටර් රථ වාහන කොමසාරිස් ධුරයට නොඅඩු ධුරයක් දරන නියෝජිතයකු.

(ආ) ආර්ථික විද්‍යාව, යටිතල පහසුකම් සංවර්ධනය, බැංකු කටයුතු, විදුලිබල හා බලශක්ති, විදුලි සංදේශ සහ නීතිය යන ක්ෂේත්‍ර පිළිබඳ සුදුසුකම්ලත් සහ පළපුරුදු තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් පස් දෙනකු.

(2) උපදේශක සභාවේ කර්තව්‍ය වනුයේ—

(අ) මාර්ග භාවිත කරන්නන්ගේ ගමන් කාලය අඩු කිරීම සහ වැඩිදියුණු පහසුකම් සහිත පහසු ගමනාගමනයක් සැපයීම මගින් මාර්ග භාවිත කරන්නන්ට පහසුකම් සැලසීමේ අරමුණින් පාලම්, පාරු සේවා ඇතුළුව (මෙහි මින් මතු ''පද්ධති ප්‍රතිපත්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) උසස් මහා මාර්ග පද්ධති ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහි ලා අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ආ) මාර්ගවල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කරන ලද උසස් මාර්ග පද්ධති ක්‍රමෝපාය සංවර්ධනය කිරීම පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ඇ) මාර්ග පිළිබඳ පර්යේෂණ, මාර්ග සැලසුම්, මාර්ග සංවර්ධන තාක්ෂණය සහ මාර්ග ආරක්ෂණ පියවර සම්බන්ධයෙන් ගනු ලැබිය යුතු පියවර පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ඈ) අධිකාරිය විසින් උපදේශක සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, මහා මාර්ග, ජාතික මහා මාර්ග, අධිවේගී මහාමාර්ග සහ සීමිත ප්‍රවේශ මහා මාර්ග සැලසුම් කිරීම හා සම්බන්ධ කාරණා පිළිබඳව අවශ්‍ය උපදෙස් ලබා දීම ;

(ඉ) උපදේශක සභාව වෙත වරින් වර අමාත්‍යවරයා විසින් යොමු කරන වෙනත් කාරණා පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම.

(3) (අ) උපදේශක සභාවේ සෑම සාමාජිකයකුම අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර නැවත පත් කිරීම සඳහා සුදුසු විය යුතු ය ;

අමාත්‍යවරයා විසින් එසේ කිරීම යෝග්‍ය යයි සලකනු ලබන්නේ නම්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් තත්කාර්ය සඳහා හේතු දක්වා උපදේශක සභාවේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය ;

(ආ) උපදේශක සභාවේ සාමාජිකයකු විසින් තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් සිය ධුරයෙන් ඕනෑම අවස්ථාවක දී ඉල්ලා අස්විය හැකි ය ;

(ඇ) උපදේශක සභාවේ යම් සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සිදුවන අවස්ථාවක දී, එම මියයන, ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරන සාමාජිකයාගේ ධුරය සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය ;

(ඈ) (ඇ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයකු මියයෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා කලින් සිය ධුරය අත්හරින්නේ නම් මිස ඔහුගේ පූර්වගාමියාගේ සේවා කාලයේ ඉතිරි සේවා කාලය සඳහා ධුරය දැරිය යුතු ය ;

(ඉ) උපදේශක සභාව වෙතින් ස්වකීය සාමාජිකයන්ගේ පුරප්පාඩුවක් හෝ එවැනි යම් සාමාජිකයකුගේ පත් කිරීමේ යම් දෝෂයක් තිබුන ද එය නොතකා, තම කර්තව්‍ය ඉටු කරනු ලැබිය හැකි ය ;

(ඊ) උපදේශක සභාවේ යම් රැස්වීමක ගණපූරණය උපදේශක සභාවේ සාමාජිකයන් අට දෙනකුගෙන් සංයුක්ත විය යුතු අතර, මේ පනතේ විධිවිධානවලට යටත්ව උපදේශක සභාව විසින් රැස්වීම්වල කටයුතු පිළිබඳව ක්‍රියා පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය ;

(උ) මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික උපදේශක සභාවේ සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය හැකි ය.

7. (1) (මෙහි මින් මතු "දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක් සඳහාම දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවක් බැගින් පිහිටුවනු ලැබිය යුතු අතර, ඒවා පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :— දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටුව.

(අ) එම දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතරින් ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද සියලුම කැබිනට් අමාත්‍යවරු සහ වෙනත් අමාත්‍යවරු ;

(ආ) එම දිස්ත්‍රික්කය නියෝජනය කරන ප්‍රධාන අමාත්‍යවරයා ;

(ඇ) අදාළ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ සියලු අමාත්‍යවරු ;

(ඈ) අදාළ දිස්ත්‍රික්කය නියෝජනය කරන සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ;

(ඉ) අදාළ දිස්ත්‍රික්කය නියෝජනය කරන අදාළ පළාත් සභාවේ සියලුම මන්ත්‍රීවරු ;

(ඊ) අදාළ දිස්ත්‍රික්ක ඇතුළත සියලු පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් ;

(උ) අදාළ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ;

(ඌ) අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් ;

(එ) අදාළ දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය ලේකම්වරු ;

(ඒ) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ලේකම් විය යුතු මාර්ග සංවර්ධන අධිකාරියේ අදාළ පළාත් අධ්‍යක්ෂක ;

(ඔ) අදාළ දිස්ත්‍රික්කයේ රජයේ නියෝජිත ආයතනවල සියලු දිස්ත්‍රික් ප්‍රධානීන් ;

(ඕ) අදාළ දිස්ත්‍රික්කයේ මාර්ග භාවිත කරන්නන් විසින් පිහිටුවන ලද එක් එක් ප්‍රජා මූල සංවිධානවලින් එක් අයකු බැගින් පත් කරන සාමාජිකයන්.

(2) අමාත්‍යවරයා විසින්, (අ) සහ (ආ) ඡේදවල සඳහන් සාමාජිකයන් අතරින් එක් තැනැත්තකු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ලෙස නම් කරනු ලැබිය හැකි ය.

(3) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ කර්තව්‍ය විය යුත්තේ—

(i) දිස්ත්‍රික්කය සඳහා ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලසුමක් සකස් කිරීම ;

(ii) දිස්ත්‍රික්කය ඇතුළත සියලු මාර්ග පද්ධති සංවර්ධන කටයුතු සහ නඩත්තු කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම ;

(iii) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව දිස්ත්‍රික්කය ඇතුළත මාර්ග සංවර්ධන ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට යම් රජයේ නියෝජිත ආයතනයකට හෝ යම් තැනැත්තකුට භාර කිරීම සහ එකී ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, විධිමත් කිරීම සහ අධීක්ෂණය කිරීම ;

(iv) පවත්නා මාර්ගයක යම් පුළුල් කිරීමක් හෝ වෙනතකට හැරවීමක් ඇතුළුව මාර්ග සංවර්ධන ව්‍යාපෘති භාරගෙන ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

(4) (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තු සඳහා ක්‍රියාකාරී සැලසුම යන්නෙන් මාර්ග සංවර්ධන අධිකාරිය, අදාළ පළාත් සභාව, අදාළ පළාත් පාලන ආයතන සහ වෙනත් අදාළ නියෝජ්‍ය ආයතන විසින් භාර ගැනීමට ඇති දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති නිශ්චිතව දක්වන්නා වූ සැලසුමක් අදහස් වේ. එවැනි සැලසුමක් අවුරුදු පහක කාලසීමාවක් ආවරණය වීම සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එහි නිශ්චිතව දක්වා ඇති සංවර්ධන සහ නඩත්තු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ප්‍රාග්ධනය ඇතුළත් උපලේඛනයක් ඊට ඇතුළත් විය යුතු ය.

(5) 6 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව සාමාජික කාලසීමාව, සාමාජිකත්වය හිස්වීම, කමිටුවේ හිස් වූ ධුරයක් සඳහා සාමාජිකයකු පත් කිරීම සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනෙකුත් අදාළ කරුණු සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## III වන කොටස

## ජාතික මහාමාර්ග

ජාතික මහාමාර්ග ප්‍රකාශයට පත් කිරීම.

8. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් යම් මාර්ගයක් හෝ මහා මාර්ගයක් හෝ මාර්ග හෝ මහා මාර්ග පද්ධතියක් අවස්ථාවෝචිත පරිදි ජාතික මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ග ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින්—

(අ) යම් මාර්ගයක් හෝ මහා මාර්ගයක් යටත් පිරිසෙයින් එක් පළාත් මායිමක් හරහා ගමන් කරන බවට සහ පළාත් මධ්‍යස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් සම්බන්ධ කරන බවට සහ එම මාර්ගය හෝ මහා මාර්ගය දුර ගමනාගමනය සඳහා ප්‍රධාන මහා මාර්ගයක් බවට ;

(ආ) යම් මාර්ගය හෝ මහා මාර්ගයක්, දිනකට වාහන දෙසීය පනහකට වඩා වැඩි වාහන ප්‍රමාණයක් ගමන් කරන්නා වූ ප්‍රධාන මාර්ග දෙකකට සම්බන්ධ වන බවට ;

(ඇ) යම් මාර්ගයක් හෝ මහා මාර්ගයක් වැදගත් නගර මධ්‍යස්ථාන අතරින් ගමන් කරන බවට ;

(ඈ) යම් මාර්ගයක් හෝ මහා මාර්ගයක් අනෙකුත් ජාතික මහා මාර්ගවලට සම්බන්ධවීම සලස්වන ප්‍රධාන ගංගා හරහා යා හැකි සුවිශේෂී වැදගත්කමකින් යුත් පාලම් ඇති බවට ;

(ඉ) ඒ මාර්ගය හෝ මහා මාර්ගය ජාතික වැදගත්කමක් ඇති ස්ථානයකට හෝ රජයේ විශේෂ යෝජනා ක්‍රමයකට ප්‍රවේශය සලසන බවට ; හෝ

(ඊ) යම් මාර්ගයක් හෝ මහා මාර්ගයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ II වන ලැයිස්තුවේ (සංවෘතිත ලැයිස්තුවේ) දක්වා ඇති විෂය කරුණුවට අදාළ ආයතනයකට, ගොඩනැගිල්ලකට, වැඩ බිමකට හෝ ප්‍රදේශයකට ප්‍රවේශය සලසන බවට,

සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් ඒ මාර්ගය හෝ මහා මාර්ගය (1) වන උපවගන්තිය යටතේ ජාතික මහා මාර්ගයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

අධිවේගී මාර්ග ආදිය ප්‍රකාශයට පත්කිරීම.

**9.** (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, 8 වන වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත් කරන ලද ජාතික මහා මාර්ගයක්—

(අ) අධිවේගී මහා මාර්ගයක් බවට ; හෝ

(ආ) සීමිත ප්‍රවේශ මහාමාර්ගයක් බවට,

නම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ජාතික මහා මාර්ගයක්, අධිවේගී මහා මාර්ගයක් හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක් වශයෙන් නම් කිරීම සඳහා—

(අ) එම ජාතික මහා මාර්ගය අධිවේගීව මෝටර් වාහන ගමනාගමනය සඳහා බලපෑම් අවම වන පරිදි අධිවේගීව මෝටර් රථ ගමනාගමනය සඳහා විශේෂයෙන් සැලසුම් කර තිබිය යුතු ය ;

(ආ) එම ජාතික මහා මාර්ගය මගින් ඒ මාර්ගයට මායිම්ව පිහිටි දේපළවලට ප්‍රවිශ්ඨ වීමට ඉඩකඩ නොසැලසිය යුතු ය.

(3) ජාතික මහා මාර්ගයක අධිවේගීව මෝටර් වාහන ගමනාගමනය සඳහා බලපාන්නා වූ, එකී ජාතික මහා මාර්ග දිගේ ඇති අන්තර් හුවමාරු ස්ථාන ප්‍රමාණය අවම බවට අමාත්‍යවරයා සෑහීමට පත් වන්නේ නම්, 1 වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් එකී ජාතික මහා මාර්ගය අධිවේගී මහා මාර්ගයක් බවට නම් කරනු ලැබිය හැකි ය.

(4) යම් ජාතික මහා මාර්ගයක අධිවේගීව මෝටර් වාහන ගමනාගමනය සඳහා බලපාන්නා වූ එකී ජාතික මහා මාර්ගය දිගේ ඇති අන්තර් හුවමාරු ස්ථාන ප්‍රමාණය සංසන්දනාත්මකව වැඩි බවට අමාත්‍යවරයා සෑහීමට පත් වන්නේ නම්, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ යම් ජාතික මහා මාර්ගයක් සීමිත ප්‍රවේශ මහා මාර්ගයක් ලෙස නම් කරනු ලැබිය හැකි ය.

8 වන සහ 9 වන වගන්ති යටතේ වූ ප්‍රකාශ සඳහා වූ අවශ්‍යතා.

**10.** (1) 8 සහ 9 වන වගන්ති යටතේ වූ සෑම ප්‍රකාශයක් සමගම—

(අ) (i) ජාතික මහා මාර්ගය සමන්විත වන භූමි ප්‍රදේශය නිශ්චිතව දක්වමින් ;

(ii) ජාතික මහා මාර්ගය දිගේ ඇති අන්තර් හුවමාරු ස්ථාන ප්‍රමාණය නිශ්චිතව දක්වමින් ;

(iii) ජාතික මහා මාර්ගයේ අංගෝපාංග නිශ්චිතව දක්වමින් ; සහ

(iv) ඉදිකිරීම් සීමා සහ මාර්ග අයිතියේ දිග සහ පළල නිශ්චිතව දක්වමින්,

සැලසුමක් ද ඒ සමග ඉදිරිපත් කළ යුතු ය ; සහ

(ආ) එකී ජාතික මහා මාර්ගය හැඳින්විය යුතු නම නිශ්චිතව දැක්විය යුතු ය.

## IV වන කොටස

### ගාස්තු ගෙවිය යුතු ජාතික මහාමාර්ග

අමාත්‍යවරයා විසින් ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග ප්‍රකාශයට පත් කළ හැකි බව.

**11.** (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, යම් අධිවේගී මහා මාර්ගයක් සම්පූර්ණයෙන් ම හෝ එවැනි මාර්ගයක කොටසක් හෝ ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශය මගින් එකී ප්‍රකාශයක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු කාලසීමාව නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

අධිකාරිය විසින් ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් සම්බන්ධයෙන් පාර්ශ්වයක් සමග ගිවිසුම්වලට ඇතුළත් විය හැකි බව.

**12.** (1) අධිකාරිය විසින් රාජ්‍ය දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක් හෝ පුද්ගලික ආයතනයක් ඇතුළත්ව යම් තැනැත්තකු හෝ පාර්ශ්වයක් සමග (මෙහි මින් මතු ''මෙහෙයුම්කරු'' යනුවෙන් හඳුන්වනු ලබන) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක සැලසුම් කිරීම, ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම, සංවර්ධනය සහ සමස්ත කළමනාකරණය සම්බන්ධයෙන් ගිවිසුම්වලට ඇතුළත් විය හැකි ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙහෙයුම්කරුට පවරා දෙනු ලැබිය හැකි ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී පවරාදීමේ කුමක් සඳහන් වුව ද එය නොතකා, එසේ පවරා දෙන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ගිවිසුම මගින්—

(අ) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක හෝ එහි යම් කොටසක සැලසුම් කිරීම, ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ නඩත්තු කිරීම සඳහා මූල්‍ය පහසුකම් සැලසීම සඳහා අරමුදල් සැපයීම;

(ආ) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් සඳහා ඉඩම් මිල දී ගැනීම, බද්දට ගැනීම හෝ පැවරීම;

(ඇ) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම;

(ඈ) ගිවිසුමේ එක් එක් පාර්ශ්වයේ අයිතිවාසිකම්, වගකීම සහ කාර්යයන් වෙන් වෙන් වශයෙන් භාර කිරීම;

(ඉ) විදේශ මුදල් උච්චාවචනයක් සහ උද්ධමනයට අනුකූල වන පරිදි ගනුදෙනු නිවැරදිව සකස් කිරීමේ ක්‍රමය හෝ ආකාරය;

(ඊ) ගිවිසුමේ නියමයන් පිළිබඳව නැවත සාකච්ඡා කිරීම සහ අහඹු හෝ හදිසි අවස්ථා සම්බන්ධයෙන් අවශ්‍ය විධිවිධානයක්;

(උ) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග පාවිච්චි කරන්නන්ගෙන් පාවිච්චි කිරීමේ ගාස්තු එකතු කිරීමේ ආකාරය;

(ඌ) මෙහෙයුම්කරුවන්ගේ සහ වෙනත් සේවා නියුක්තයන්ගේ ගෙවීම් සහ පාරිශ්‍රමික;

(එ) (උ) ඡේදයේ සඳහන් ගාස්තුවලින් උපචිත වන ආදායම වෙන්කර දීම සහ බෙදා හැරීම ;

(ඒ) ඉටුකිරීමේ අවශ්‍යතා, ඉටුකිරීමේ පියවර සහ එකී ඉටුකිරීමේ අවශ්‍යතා සපුරාලීමට අපොහොසත්වීමෙන් ඇතිවන ප්‍රතිඵල නිශ්චිතව දැක්වීම; සහ

(ඔ) විධානාත්මක කාර්ය පටිපාටිය, සාක්ෂිමය විධිවිධාන සහ සමතයට පත් කිරීමේ හෝ බේරුම් කිරීමේ ගාස්තු වෙන් කිරීම ඇතුළුව ගිවිසුමට අදාළ ආරවුල් සමතයක් හෝ බේරුම් කිරීමක් මගින් විසඳා ගැනීම

සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් සඳහා අයකළ යුතු ගාස්තු අමාත්‍යවරයා විසින් නියම කළ හැකි බව.

13. අමාත්‍යවරයා විසින් ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග භාවිත කරනු ලබන සියලු වාහනවලින් අයකළ යුතු ගාස්තු නියම කරනු ලැබිය හැකි අතර, විවිධ වර්ගවලට අයත් වාහනවලට විවිධ ප්‍රමාණයේ ගාස්තු නියම කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් ගාස්තු අයකිරීමෙන් බැහැර කළ යුතු වාහන වර්ග පිළිබඳව ද නියම කරනු ලැබිය හැකි ය.

ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක දී වාහනයක රියදුරු විසින් ගාස්තු ගෙවිය යුතු බව.

14. (1) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක වාහනයක් ධාවනය කරනු ලබන රියදුරු විසින් 13 වන වගන්තියේ සඳහන් ගාස්තු නියමිත ස්ථානවල දී නියමිත තැනැත්තන්ට ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරනු ලබන වාහනයක රියදුරකු වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු—

(අ) පළමුවන වතාවට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන් දහස නොඉක්මවන දඩයකට ; සහ

(ආ) දෙවන වතාවට හෝ ඊට වැඩි වාර ගණනකට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

## V වන කොටස

### මාර්ග ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම

අලුත් මාර්ග ඉදිකිරීම.

15. (1) අමාත්‍යවරයා විසින්, අදාළ දිස්ත්‍රික් මාර්ග පද්ධති සම්බන්ධීකරණ කමිටුවේ හෝ අදාළ පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ හෝ අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගේ හෝ එකී ප්‍රදේශයේ ක්‍රියාත්මක වන ප්‍රජාමූල සංවිධානයක නිර්දේශ මත :—

(අ) අලුත් මාර්ගයක් හෝ මහා මාර්ගයක් ඉදිකිරීම සඳහා ; හෝ

(ආ) පවත්නා මාර්ගයක් හෝ මහා මාර්ගයක් පුළුල් කිරීම හෝ එකී මාර්ගය මහා මාර්ගය වෙනතකට හැරවීම,

සඳහා බලය දෙනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ අලුත් මාර්ගයක් හෝ අලුත් මහා මාර්ගයක ඉදිකිරීම සඳහා බලය දෙනු ලබන අවස්ථාවක දී, එම මාර්ගයේ හෝ මහා මාර්ගයේ රක්ෂිත භූමි ප්‍රදේශය සහ ඉදිකිරීම් සීමා ඇතුළත්ව එහි දිග සහ පළල නිශ්චිතව දක්වමින්, එකී මාර්ගය හෝ මහා මාර්ගය ඉදිකිරීම සඳහා අවශ්‍ය වන ඉඩම් ප්‍රමාණය පෙන්වමින් මිනුම් පිඹුරක් පිළියෙල කිරීමට අධිකාරියට විධාන කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ අලුත් මාර්ගයක් හෝ මහා මාර්ගයක් පුළුල් කිරීම, වැඩිදියුණු කිරීම හෝ හැරවීම සඳහා බලය දෙනු ලබන අවස්ථාවක දී, රක්ෂිත භූමි ප්‍රදේශය සහ ඉදිකිරීම් සීමා ඇතුළත්ව එකී මාර්ගයේ දිග සහ පළල නිශ්චිතව දක්වමින් එකී මාර්ගය හෝ මහා මාර්ගය පුළුල් කිරීම, වැඩිදියුණු කිරීම හෝ හැරවීම සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් පෙන්වමින් මිනුම් පිඹුරක් සකස් කරන ලෙසට අධිකාරිය වෙත අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(4) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අවස්ථාවෝචිත පරිදි, (2) වන උපවගන්තියේ හෝ (3) වන උප වගන්තියේ සඳහන් මිනුම් පිඹුර මගින් පෙන්වා ඇති ඉඩම් ප්‍රදේශය හෝ එහි යම් බැඳියාවක්, අවස්ථාවෝචිත පරිදි මාර්ගයක රක්ෂිත ප්‍රදේශයේ හෝ මහා මාර්ගයක රක්ෂිත ප්‍රදේශය ලෙස නියම කරනු ලැබිය හැකි ය.

(5) අදාළ නියමය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු, ඉදිකිරීම් සීමා ඇතුළත ගොඩනැගිලි ඉදිකිරීම හෝ නැවත ඉදිකිරීම තහනම් කිරීමට අදාළ මේ පනතේ විධිවිධාන, එකී නියමයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම් ප්‍රදේශයට හෝ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

නව ජාතික මහා මාර්ග ඉදිකිරීම.

16. (1) අමාත්‍යවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි උපදේශක සභාවේ හෝ අධිකාරියේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත නව ජාතික මහාමාර්ගයක් ඉදිකිරීමට බලය දෙනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් අලුත් ජාතික මහා මාර්ගයක් ඉදිකිරීම සඳහා බලය දෙනු ලබන අවස්ථාවක දී, ඔහු විසින්, විවේකය හා විනෝද කටයුතු වෙළඳපල සහ වෙනත් උපකාරක සේවාවන් ද ඇතුළුව එකී ජාතික මහා මාර්ගයේ දිග සහ පළල, රක්ෂිත ප්‍රදේශ සහ ඉදිකිරීම් සීමා සහ යෝජිත අන්තර් හුවමාරු ස්ථාන සහ එකී මාර්ගය ඔස්සේ හරස් මාර්ග ඇත්නම් ඒවා ද ඇතුළුව එකී ජාතික මහා මාර්ගය ඉදිකිරීමට අවශ්‍ය ඉඩම් පෙන්නුම් කරමින් යෝජිත ජාතික මහා මාර්ගයේ මිනුම් පිඹුරක් පිළියෙල කරන ලෙසට අධිකාරිය වෙත බලය දෙනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, උපදේශක සභාවේ හෝ අධිකාරියේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත පවත්නා ජාතික මහා මාර්ගයක් පුළුල් කිරීම, වැඩිදියුණු කිරීම හෝ හැරවීම සඳහා බලය දෙනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් (3) වන උපවගන්තිය යටතේ ජාතික මහා මාර්ගයක් පුළුල් කිරීම, වැඩිදියුණු කිරීම හෝ හැරවීම සඳහා බලය දෙනු ලබන අවස්ථාවක දී, ඔහු විසින්, එකී ජාතික මහා මාර්ගයේ රක්ෂිතය සහ අලුත් ඉදිකිරීම් සීමා සහ අන්තර් හුවමාරු සහ හරස් මාර්ග ඇත්නම් ඒවා ද ඇතුළුව අලුත් ජාතික මහා මාර්ගයේ අලුත් දිග සහ පළල නිශ්චිතව දක්වමින් විවේකය සහ විනෝද කටයුතු, වෙළඳපල කටයුතු සහ වෙනත් උපකාරක සේවාවක් සඳහා

වූ පහසුකම් ද ඇතුළුව, එකී මාර්ග පුළුල් කිරීම හෝ හැරවීම සඳහා අවශ්‍ය වන ඉඩම් ප්‍රදේශය පෙන්නුම් කරමින් මිනුම් පිඹුරක් සකස් කරන ලෙසට අධිකාරිය වෙත විධාන කරනු ලැබිය යුතු ය.

(5) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි (2) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ සඳහන් කර ඇති මිනුම් පිඹුරක පෙන්නුම් කර ඇති ඉඩම් ප්‍රදේශය හෝ එහි යම් බැඳියාවක් ජාතික මහා මාර්ගයක රක්ෂිත ප්‍රදේශය ලෙසට ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(6) අදාළ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු, ඉදිකිරීම් සීමාවක් ඇතුළත යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ නැවත ඉදිකිරීම තහනම් කිරීමට අදාළව මේ පනතේ විධිවිධාන එකී නියමයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම් ප්‍රදේශයට හෝ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මාර්ග රක්ෂිතයක් ඇතුළත සංවර්ධන වැඩ කටයුතු තහනම් කිරීම.

17. මේ පනතේ මේ කොටස යටතේ මාර්ග රක්ෂිතයක් හෝ මහා මාර්ග රක්ෂිතයක් හෝ ජාතික මහා මාර්ග රක්ෂිතයක් ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස, යම් රජයේ නියෝජිත ආයතයනක් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් එසේ රක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයක් ඇතුළත කිසිම සංවර්ධන ක්‍රියාවක් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මකවීමට සැලැස්වීම නොකළ යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත අදාළවීම.

18. (1) යම් ඉඩමක් හෝ ඒ ඉඩමේ යම් සම්බන්ධතාවක් අවස්ථාවෝචිත පරිදි මාර්ග රක්ෂිතයක්, මහාමාර්ග රක්ෂිතයක් හෝ ජාතික මහාමාර්ග රක්ෂිතයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක—

(අ) එකී ඉඩම හෝ ඒ ඉඩමේ සම්බන්ධතාවය (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ කාර්ය සඳහා මහජන අවශ්‍යතාවයක් සඳහා අවශ්‍ය කරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) එකී ඉඩම හෝ එම ඉඩමේ සම්බන්ධතාවය (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා රජය විසින් අත්කර ගනු ලැබිය හැකි ය.

(2) මාර්ග රක්ෂිතයක් හෝ මහා මාර්ග රක්ෂිතයක් හෝ ජාතික මහා මාර්ග රක්ෂිතයක් බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවයක් ද එම ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාවය අවස්ථාවෝචිත පරිදි මාර්ග ව්‍යාපෘතියක් , මහා මාර්ග ව්‍යාපෘතියක් හෝ ජාතික මහා මාර්ග ව්‍යාපෘතියක් සෑදීමේ කාර්ය සඳහා අවශ්‍ය බවට සහ එම ව්‍යාපෘතිය මහජනතාවගේ සාමාන්‍ය සුභසිද්ධියේ සාධාරණ අවශ්‍යතාවලට අවශ්‍ය බවට අමාත්‍යවරයාගේ නිර්දේශය මත ජනාධිපතිවරයාගේ මතය වන අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එම නියමයේ සඳහන් අවස්ථාවෝචිත පරිදි, එම රක්ෂිතයේ ඇති ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාවය එම ව්‍යාපෘතියේ කාර්ය සඳහා අවශ්‍ය බවට ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන වගන්තිය යටතේ නියමයක් පළ කරනු ලැබීමෙන් පසු, 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ 3, 4, 5, 6, 7 සහ 8 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව මේ පනතේ විධිවිධාන යටතේ ඉඩම් අත්කර ගැනීමට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

පළාත් පාලන ආයතනයක් වෙත සතු කර ඇති ඉඩම් අත්කර ගැනීම.

19. (1) පළාත් පාලන ආයතනයක් වෙත පවරා ඇති යම් මාර්ග රක්ෂිතයක, මහා මාර්ග රක්ෂිතයක හෝ ජාතික මහා මාර්ග රක්ෂිතයක යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවක් මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය බවට අමාත්‍යවරයා විසින් සහතික කරන අවස්ථාවක දී, අදාළ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා, විමසා, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එකී නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව සහ එකී නියමයේ සඳහන් කරනු ලබන දිනයක සිට බලාත්මක වන පරිදි එකී ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාවය අධිකාරිය වෙත සතු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමය මගින්, එකී නියමයේ සඳහන් කර ඇති දිනයක සිට බලපැවැත්වෙන පරිදි සියලු බැඳීම්වලින් නිදහස්ව යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවය සහ එකී නියමයේ සඳහන් කර ඇති පරිදි එකී ඉඩම මත පිහිටි ගොඩනැගිලි හෝ ඉදිකිරීම්වල පරම අයිතිය, අධිකාරිය වෙත පවරනු ලැබිය යුතු ය. එකී ඉඩම හෝ එම ඉඩමේ සම්බන්ධතාවයක් හෝ ඒ මත ඉදිකර ඇති ගොඩනැගිලි හෝ වෙනත් ඉදිකිරීම් සම්බන්ධයෙන් අධිකාරිය විසින් වන්දි මුදල් ගෙවනු ලැබිය යුතු ය.

රජයේ ඉඩම් ආඥාපනත යටතේ විශේෂ ප්‍රදාන.

20. (1) මේ පනතේ මේ කොටස යටතේ නිශ්චිතව දක්වා ඇති යම් කාර්යයක් සඳහා රජයේ ඉඩමක් හෝ රජයේ ඉඩමකින් කොටසක් අවශ්‍ය වන අවස්ථාවක එම කාර්යය (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් ලබාදිය යුතු කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අධිකාරිය සන්තකයේ පවතින හෝ අධිකාරිය විසින් පාවිච්චි කරනු ලබන සහ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියමයක නිශ්චිතව දක්වා ඇති සියලු ජාතික මහා මාර්ග සහ ඒවායේ ඉදිකිරීම්වල මාර්ග අයිතිය ද ඇතුළුව සියලු වත්කම් නියමිත දිනයේ සිට බලාත්මක වන පරිදි අධිකාරිය වෙත පවරා සතු කරනු ලැබිය යුතු ය.

නැවත පදිංචිය සඳහා ඉඩම් මිල දී ගැනීම.

21. (1) අමාත්‍යවරයාගේ අනුමතය සහ අයිතිකරුවන්ගේ කැමැත්ත ඇතිව අධිකාරිය විසින් මිතින්දෝරු සැලැස්මේ සහ මේ පනතේ 15, 16 සහ 19 වගන්තිවල සඳහන් නියමයේ දක්වා ඇති ඉඩමක් හෝ එහි යම් සම්බන්ධතාවක් මිල දී ගනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම නිසා අවතැන් වූ හෝ බලපා ඇති තැනැත්තන් නැවත පදිංචි කරවීම සඳහා අවශ්‍ය ඉඩම් අමාත්‍යවරයාගේ අනුමතය මත අධිකාරිය විසින් මිල දී ගනු ලැබිය හැකි ය.

කමිටුවක් විසින් ගත යුතු තීරණ.

22. 21 වන වගන්තිය යටතේ ඉඩමක ගැනුම් මිල සහ වෙනත් සම්බන්ධිත කරුණු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවක් විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය :—

(අ) මහා මාර්ග විෂයය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඇ) ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඈ) ප්‍රධාන තක්සේරුකරු හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ඉ) තක්සේරු ආයතනය විසින් නම් කරනු ලබන ලියාපදිංචි බලයලත් තක්සේරුකරුවකු.

ඉඩම් අන්සතු කිරීම සඳහා අධිකාරියට ඇති බලය.

23. (1) මාර්ගයක් හෝ මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් නඩත්තු කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව අධිකාරිය විසින් දරනු ලබන යම් ඉඩමක් හෝ එහි යම් සම්බන්ධතාවක් අධිකාරිය විසින් අන්සතු කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ අධිකාරිය විසින් අන්සතු කරනු ලබන යම් ඉඩමක් සම්බන්ධයෙන් රජයේ ඉඩම් ආඥාපනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා අන්සතු කිරීම යන්නට විකිණීම, බදුදීම, කුළියට දීම, කුලී සින්නක්කර හෝ ප්‍රදාන ඇතුළත් විය යුතු ය.

## VI වන කොටස

## වැඩ ඉටුකිරීම

වැඩ පිළිබඳ විධාන සහ පාලනය අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු විය යුතු බව.

24. මේ පනත යටතේ භාරගත යුතු සියලු වැඩ පිළිබඳ විධාන කිරීම සහ පාලනය අධිකාරියේ පොදු විධානය සහ පාලනයට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු විය යුතු ය.

මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් තාවකාලිකව වසා දැමීම සඳහා අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි බව.

25. (1) අමාත්‍යවරයා විසින් අධිකාරියේ නිර්දේශය මත හෝ අධිකාරිය විසින් පවරන ලද බලතල යටතේ ක්‍රියාකරන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්—

(අ) (i) පවත්නා මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් ; හෝ

(ii) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක කොටසක් ; හෝ

(iii) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක වූ පාලමක්,

තාවකාලිකව හෝ ස්ථිරව වසා දැමීම; හෝ

(ආ) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක පවත්නා කොටසක් වෙනුවට විකල්ප ගමන් පථයක් හෝ විකල්ප මාර්ග කොටසක් ආදේශ කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ යම් නියමයක් ක්‍රියාත්මක කිරීමේ දී එකී කාර්ය සඳහා ඉඩමක් අත්කර ගැනීම අවශ්‍ය වන්නේ නම් එකී ඉඩම පොදු කාර්යයක් ලෙස අවශ්‍ය බවට සලකනු ලැබිය යුතු අතර, V වන කොටසේ විධිවිධාන එකී අත්කර ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අධිකාරියේ අවසරය නොමැතිව මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක කිසිම සේවාවක් පවත්වාගෙන නොයා යුතු බව.

26. (1) කිසිම තැනැත්තෙක්, රජයේ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක් හෝ වෙනත් යම් ආයතනයක් විසින්, අවස්ථාවෝචිත පරිදි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ, පළාත් අධ්‍යක්ෂවරයාගේ, ප්‍රධාන ඉංජිනේරුවරයාගේ හෝ විධායක ඉංජිනේරුවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව, විදුලිය, විදුලි සංදේශ, ජලය, ගෑස් හෝ වෙනත් සේවාවන් සඳහා මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක රක්ෂිතය පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ සඳහන් යම් සේවාවක් සඳහා මාර්ග රක්ෂිතයක්, මහා මාර්ග රක්ෂිතයක් හෝ ජාතික මහා මාර්ග රක්ෂිතයක් පාවිච්චි කිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අධිකාරිය විසින් මේ වගන්තියේ සඳහන් යම් තැනැත්තකුගෙන් හෝ ආයතනයකින් ගාස්තුවක් අයකරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් උපදේශක සභාවෙහි නිර්දේශ මත කලින් කළ මේ පනත යටතේ අය කළ යුතු උචිත ගාස්තු සහ ගාස්තු අයකිරීමට අදාළ වෙනත් කරුණු පිළිබඳව නියම කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව සහ තත් කාර්ය සඳහා වූ යම් විශේෂ ප්‍රඥප්තියක විධිවිධානවලට යටත්ව අධිකාරිය වෙනුවෙන් අවස්ථාවෝචිත පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා, පළාත් අධ්‍යක්ෂවරයා, ප්‍රධාන ඉංජිනේරුවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින්, ගෑස්, ජලය, විදුලිබලය, විදුලි සංදේශ, හෝ වෙනත් සේවාවක් පවත්වාගෙන යාමේ කාර්ය සඳහා, යම් මාර්ග රක්ෂිතයක්, මහා මාර්ග රක්ෂිතයක් හෝ ජාතික මහා මාර්ග

රක්ෂිතයක් යම් තැනැත්තකු, රජයේ දෙපාර්තමේන්තුවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ වෙනත් යම් ආයතනයක් විසින් පාවිච්චි කිරීම සඳහා බලය දීමට සහ පරිපාලනය කිරීම සඳහා එම තැනැත්තා, දෙපාර්තමේන්තුව හෝ පළාත් පාලන ආයතන හෝ වෙනත් ආයතන සමඟ ගිවිසුම්වලට ඇතුළත් විය හැකි ය.

(5) මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම හෝ බෙදීම කරනු ලබන අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ පළාත් අධ්‍යක්ෂවරයා හෝ ප්‍රධාන ඉංජිනේරුවරයා හෝ විධායක ඉංජිනේරුවරයා විසින්, යම් තැනැත්තකු විසින් ඉදිකර ඇති හෝ යොදා ඇති යම් භෞතික ඉදිකිරීමක් හෝ නල මාර්ගයක් දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලයක් ඇතුළත එම තැනැත්තාගේ වියදමින් ඉවත් කරන ගන්නා ලෙස එම තැනැත්තාට නිවේදනයක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

(6) යම් විරෝධතාවක් නිසා හෝ එකී බාධකය ඇති කිරීම සඳහා වගකිවයුතු තැනැත්තා සොයාගනු ලැබිය නොහැකිවීම නිසා මේ වගන්තියේ සඳහන් බාධකය ඉවත් කිරීම සඳහා විධායක ඉංජිනේරුවරයාට නොහැකි හෝ අකැමැති අවස්ථාවක දී, විධායක ඉංජිනේරුවරයා විසින් තත්කාර්ය සඳහා අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(7) එකී ඉල්ලීමේ, කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසුව මහෙස්ත්‍රාත්වරයා විසින් එකී බාධකය ඉවත් කරන ලෙස පිස්කල්වරයා වෙත නියෝග කරනු ලැබිය හැකි ය.

(8) මේ පනතේ 90 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධානවලට යටත්ව මෙම වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල නිශ්චිතව දක්වා ඇති යම් සේවාවක් සැපයීම හා සම්බන්ධ යම් කාර්ය සඳහා මාර්ග රක්ෂිත, මහා මාර්ග රක්ෂිත හෝ ජාතික මහා මාර්ග රක්ෂිත භාවිත කරනු ලබන යම් තැනැත්තකුට, රජයේ දෙපාර්තමේන්තුවකට, පළාත් පාලන ආයතනයකට හෝ වෙනත් ආයතනයකට නියමිත දිනයේ සිට සහ ඉන් පසුව මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

තිසිදු මහජන සේවාවක් හෝ පෞද්ගලික ව්‍යවසායක් විසින් අවසරයක් නොමැතිව මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් ප්‍රයෝජනයට නොගත යුතු බව.

27. (1) කිසිම තැනැත්තකු විසින්, 26 වන වගන්තියේ සඳහන් ගිවිසුමක වූ නියම සහ කොන්දේසි යටතේ හෝ ඒවාට අනුව මිස, යම් මහජන සේවාවක් හෝ පෞද්ගලික ව්‍යවසායක කාර්ය සඳහා මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් ප්‍රයෝජනයට ගැනීම හෝ ඒ මත යම් දෙයක් ඉදිකිරීම, යන්ත්‍රයක් සවි කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

එසේ වූ ද යම් ගිවිසුමක් ප්‍රකාරව, යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් කැනීම, හැරීම හෝ කැපීම ආරම්භ කිරීම සඳහා අවසර දීමට පෙර, එකී මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය කැනීම හෝ හැරීම හෝ කැපීම නිසා සිදුවන එම මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය යථා තත්ත්වයට පත් කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා වැය වන බවට ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් ඇස්තමේන්තු කරනු ලබන පිරිවැය සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආපසු ගෙවිය හැකි අමතර තැන්පතුවක්, අධිකාරිය වෙත ගෙවනු ලැබිය යුතු ය :

එසේම තවදුරටත් ඇස්තමේන්තු කරන ලද වියදමට වැඩි යම් අමතර වියදමක් අධිකාරිය විසින් දරන ලද නම් එකී මුදල අධිකාරිය වෙත ගෙවන ලද අමතර ආපසු ගෙවනු ලබන තැන්පතුවෙන් අඩු කර එසේ අඩු කිරීමෙන් පසු ඉතිරිවන මුදල ඉන් පසුව ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ යම් විධිවිධානයක් කඩ කරන හෝ එකඟව කටයුතු කිරීම පැහැර හරින ඕනෑම තැනැත්තකු වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් කරනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහස නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

විධායක ඉංජිනේරුවරයා විසින් බාධක ඉවත් කරනු ලැබිය හැකි බව.

28. (1) 26 වන වගන්තියේ සඳහන් යම් ගිවිසුමක හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, 26 වන වගන්තියේ සඳහන් ගිවිසුමකට අනුව, යම් මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක බාධකයක් ඇති කර ඇති හෝ යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් පුළුල් කිරීම හෝ වැඩි දියුණු කිරීම හෝ බෙදීම සඳහා බාධකයක් ඇති කර ඇති යම් තැනැත්තකු වෙත, දැන්වීමේ නිශ්චිතව දැක්වෙන කාලයක් ඇතුළත විධායක ඉංජිනේරුවරයා සෑහීමට පත්වන ආකාරයට එම බාධකය ඉවත් කිරීම හෝ වැළැක්වීම සඳහා විධායක ඉංජිනේරුවරයා විසින් දැන්වීමක් නිකුත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) එකී තැනැත්තා විසින් එකී බාධකය ඉවත් කිරීම හෝ වැළැක්වීම සඳහා හෝ එකී භෞතික ඉදිකිරීම හෝ නල මාර්ගය ඉවත් කිරීමට එකී කාලය ඇතුළත කිරීම පැහැර හරින හෝ අතපසු කරන අවස්ථාවක, විධායක ඉංජිනේරුවරයා විසින් හෝ ඔහු විසින් නීත්‍යනුකූලව බලය පවරන යම් තැනැත්තකු විසින් එකී බාධකය ඉවත් කිරීම හෝ වැළැක්වීම හෝ එම භෞතික ඉදිකිරීම, නල මාර්ගය වෙනත් තැනකට ගෙනයාම සිදු කිරීම නීත්‍යානුකූල විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම් අයකර ගැනීම නීත්‍යනුකූල විය යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි එකී ඉවත් කිරීම හෝ වැළැක්වීම හෝ වෙනත් තැනකට ගෙනයාම හේතුවෙන් යම් ගිවිසුමක් කඩවීම පිළිබඳව එකී තැනැත්තා වෙත කිසිම වන්දි මුදලක් ගෙවනු නොලැබිය යුතු ය.

29. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින්, තමාගේ අරමුණ එහි සිටින පදිංචිකරු වෙත දැනුම්දීමෙන් පසුව, අවශ්‍ය වාහන, උපකරණ, ආයුධ සහ වෙනත් අවශ්‍ය දේ සමඟ, යම් පවත්නා හෝ යෝජිත මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක යාබද ඉඩමකට හෝ අලුත් මාර්ග රක්ෂිතයක්, අලුත් මහා මාර්ග රක්ෂිතයක්, අලුත් ජාතික මහාමාර්ග රක්ෂිතයක් වශයෙන් අනාගතයේ දී ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ඉඩමකට දවසේ ඕනෑම සාධාරණ වේලාවක ඇතුළු විය හැකි අතර,—

මාර්ග, මහා මාර්ග සහ ජාතික මහා මාර්ග මැනීම, මිනුම් කටයුතු ආදිය සඳහා ඇතැම් තැනැත්තන්ට බලය දිය හැකි බව.

(අ) මැනීම, මිනුම් කටයුතු ලකුණු කිරීම, වැඩ කිරීම, විවෘත කිරීම, වෙනස් කිරීම, හැරවීම, අලුත්වැඩියා කිරීම, පිරිසිදු කිරීම, වැඩිදියුණු කිරීම හෝ ඒ මත වැට ඉදිකිරීම ;

(ආ) යම් පාලමක්, සපත්තු පාලමක්, පස් රඳවා ගැනීමේ ඉදිකිරීමක්, බෝක්කුවක්, කානුවක්, වැටක් හෝ අගලක් ඉදිකිරීම, කැනීම, අලුත්වැඩියා කිරීම, ශුද්ධ කිරීම හෝ වැඩිදියුණු කිරීම;

(ඇ) යම් නිලධරයකුගේ හෝ ඔහුගේ සේවකයන්ගේ ප්‍රයෝජනය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම් හෝ එවැනි නිලධාරියකු හෝ ඔහුගේ සේවකයන්ගේ පරිහරණය සඳහා යම් ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කිරීම,

යන කාර්යයන් සඳහා අවශ්‍ය සියලු ක්‍රියාවන් සහ කටයුතු සිදුකළ හැකි ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින් තමාගේ අරමුණ ඉඩමේ පදිංචිකරු වෙත දැනුම් දීමෙන් පසුව, දවසේ ඕනෑම සාධාරණ වේලාවක යම් පවත්නා හෝ යෝජිත මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක යාබද ඉඩමකට—

(අ) මැනීම, මිනුම් කටයුතු, ලකුණු කිරීම, වැඩ කිරීම, විවෘත කිරීම, වෙනස් කිරීම, හැරවීම, අලුත්වැඩියාව, පිරිසිදු කිරීම, වැඩි දියුණු කිරීම හෝ ඒ මත වැට ඉදිකිරීම;

(ආ) යම් පාලමක්, සපත්තු පාලමක්, බෝක්කුවක්, පස් රඳවා ගැනීමේ ඉදිකිරීමක්, වැටක් හෝ එහි යම් අගලක් ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම, ශුද්ධ කිරීම හෝ වැඩිදියුණු කිරීම ;

(ඇ) යම් නිලධරයකුගේ, ඔහුගේ සේවකයන්ගේ හෝ කම්කරුවන්ගේ පරිහරණය සඳහා තාවකාලික වාසස්ථානයක්, ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ අළුත්වැඩියා කිරීම,

යන කාර්ය සඳහා ඇතුලු වී එම පවත්නා හෝ යෝජිත මාර්ගයට හෝ මහා මාර්ගයට හෝ ජාතික මහා මාර්ගයට යාබද ඉඩමෙන් හෝ ආසන්න ඉඩමෙන් ජලය, දැව, කැපූ අතු, ගල්, බොරළු, වැලි හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් තිබේදැයි සෝදිසි කිරීම, හෑරීම, කැපීම, ගැනීම හෝ ගෙනයාම කරනු ලැබිය හැකි ය.

මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක අසල පිහිටි ඉඩමකට ඇතුල්වීමට අයිතියක් ඇති බව.

30. (1) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක හදිසි අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින් එකී මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය අසල පිහිටි ඉඩමකින් තත්කාර්ය සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය ඉවතට ගෙන යාම නීත්‍යනුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ යම් ක්‍රියාවක් කරන, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද නිලධරයකු හෝ සේවකයකු අයුතු ලෙස ඉඩමකට ඇතුල් වූ තැනැත්තකු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද නිලධරයකු හෝ සේවකයකු විසින් යම් ද්‍රව්‍යයක් පහසුවෙන් ම යාබදව පිහිටි රජයේ ඉඩමකින් ලබා ගත හැකි නම් ඒ ද්‍රව්‍යය වෙනත් ඉඩමකින් ලබා නොගත යුතු ය.

(4) අධිකාරිය විසින් යම් ද්‍රව්‍යයක් ඉවත් කර ගන්නා වූ ඉඩමේ අයිතිකරුට ඒ ඉවත් කර ගන්නා වූ ද්‍රව්‍ය සඳහා සහ ඒ ද්‍රව්‍ය ඉවතට ගෙනයාමේ දී සහ ප්‍රවාහනයේ දී සිදුවන අලාභහානි සඳහා සාධාරණ වන්දියක් ගෙවනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින් ද්‍රව්‍ය ලබාගන්නා වූ සෑම වලක් හෝ ආකරයක් වැටවල් ඉදිකිරීම හෝ තාවකාලික ආවරණ බාධක ඇති කිරීම මගින් සියලු ආරක්ෂණ පියවර ගත යුතු ය.

මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මත තාවකාලික ගොඩනැගිලි ඉදිකළ හැකි බව.

31. (1) යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක්, පාලමක් උස්කොට තනන ලද පදික මාර්ගයක්, බෝක්කුවක් හෝ පස් රඳවා තබා ගන්නා ව්‍යුහයක් අළුත්වැඩියා කිරීම සඳහා හෝ ඉදිකිරීම සඳහා මැණුමක් සිදු කිරීමේ දී හෝ එය වැඩි දියුණු කිරීමේ දී හෝ අළුත්වැඩියා කිරීමේ දී නැතහොත් යම් මාර්ගයක්, මහ මාර්ගයක්, ජාතික මහා මාර්ගයක්, පාලමක්, සපත්තු පාලමක්, බෝක්කුවක් හෝ පස් රඳවා තබා ගන්නා ව්‍යුහයක් අලුතින් ඉදි කිරීමේ දී, අදාළ නිලධරයන් සහ කම්කරුවන්ගේ නවාතැන් සඳහා හෝ යන්ත්‍රෝපකරණ සහ උපකරණ ගබඩා කර තැබීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින් ඊට යාබද යම් ඉඩමක් මත තාවකාලිකව ගොඩනැගිලි සෑදීම හා ඉදිකිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කාර්ය සඳහා මුඩු ඉඩමක් හෝ රජයේ ඉඩමක් හෝ ආසන්නතම දුරක ඇති අවස්ථාවක, (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද කිසිම නිලධරයකු හෝ සේවකයකු විසින් වගා කර ඇති හෝ සංවර්ධනය කර ඇති යම් ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම කරනු නොලැබිය යුතු ය.

(3) එවැනි ඉඩමක් පාවිච්චි කිරීම සඳහා සහ එයට සිදුවූ යම් හානියක් සඳහා ඒ ඉඩමේ අයිතිකරුට අධිකාරිය විසින් සාධාරණ වන්දියක් ගෙවනු ලැබිය යුතු ය.

යම් යාබද ඉඩමකට අපද්‍රව්‍ය හෝ ගල්, බොරළු ආදිය දැමිය හැකි බව.

32. (1) අලුත් මාර්ගයක්, මහා මාර්ගයක්, ජාතික මහා මාර්ගයක්, පාලමක්, සපත්තු පාලමක්, බෝක්කුවක් හෝ පස් රඳවා තබා ගන්නා ව්‍යුහයක් සඳහා මිනුම් කටයුතු කරන අවස්ථාවක දී හෝ මාර්ගයක්, මහා මාර්ගයක්, ජාතික මහා මාර්ගයක්, පාලමක්, සපත්තු පාලමක්, බෝක්කුවක් හෝ පස් රඳවා තබා ගන්නා ව්‍යුහයක් නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම හෝ ඉදිකිරීම හා සම්බන්ධ වැඩක් හෝ යම් පස් කඳු කඩා වැටීමක පස් ඉවතලීම සිදු කිරීම කරගෙන යනු ලබන කාලසීමාවක දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින් ගල්, බොරළු හෝ ඉවත දමන ද්‍රව්‍ය ඊට ආසන්න යම් ඉඩමකට දැමීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින් ඒ ඉඩමේ අයිතිකරුට හෝ පදිංචිකරුවන් හට ඇතිවන්නා වූ අනවශ්‍ය පීඩාවන් වැළැක්වීම සඳහා අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය.

තාවකාලික මාර්ග සෑදිය හැකි බව.

33. (අ) අලුත්වැඩියා කිරීම හෝ නැවත ඉදිකිරීම සඳහා පාලමක්, සපත්තු පාලමක්, බෝක්කුවක් හෝ පස් රඳවා තබා ගන්නා ව්‍යුහයක් වසා තබන කාලය තුළ ; හෝ

(ආ) ප්‍රතිසංස්කරණ කටයුතු හෝ නැවත ඉදිකිරීම සඳහා මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් හෝ මාර්ගයක්, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක කොටසක් වසා තබන කාලය තුළ,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින් රථවාහන ගමනාගමනය යාබද ඉඩම හරහා ගමන් කරවීම සඳහා තාවකාලික පාරක් ඉදිකිරීම නීත්‍යානුකූල විය යුතු ය:

එසේ වුව ද එවැනි යම් තාවකාලික පාරක් ඉදිකිරීම වෙනුවෙන් ගොඩනැගිල්ලක් කඩා දැමීම හෝ යම් හොඳින් සැකසුනු උද්‍යානයක් හෝ අංගනයක් අයුතු ලෙස පවරා ගැනීමක් සඳහා නියම කරනු නොලැබිය යුතු ය.

34. මාර්ගයකට, මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට අලාභ සිදු කරන හෝ වාහන ගමනාගමනයට, වීථි ආලෝකකරණයට, දෘෂ්ඨියට, මාර්ග සංඥාවලට ගමනා ගමන ලාම්පු සංඥා සහ මාර්ග දේපළවලට බාධා කරන සියලු ගස්, පඳුරු, වන ලැහැබ, අතු කොළ හෝ මුල් කපා ඉවත් කිරීම ද එම ගස්, පඳුරු, වන ලැහැබ, අතුකොළ හෝ මුල් කැපීම, කප්පාදු කිරීම හෝ ඉවත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද නිලධරයකු හෝ සේවකයකු විසින් යම් අවශ්‍ය කම්කරුවන්, මෙවලම් හා උපකරණ සමඟ යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළුවීම ද නීත්‍යනුකූල විය යුතු ය.

මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් ඉදිකිරීම පහසු කිරීම සඳහා ගස් කැපීම, සහ කප්පාදු කිරීම ආදිය

35. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින් යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් දිගේ වැටවල්, බාධක, අගල්, වලවල්, කානු හෝ ඉවුරු සෑදීම නීත්‍යනුකූල විය යුතු ය.

මාර්ගයක් මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ග ඔස්සේ වැටවල් ආදිය ඉදිකිරීම.

36. සියලු අගල්, කානු, බෝක්කු සහ පාලම්, විවර, දියපාර සෑදීමට, පිරිසිදු කිරීමට සහ විවෘතව තැබීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සේවකයකුට බලය තිබිය යුතු ය. ඉහත කී ක්‍රියාවලට බාධා පමුණුවන හෝ අලාභ සිදු කරන ක්‍රියාවක් හෝ දෙයක් ඒ යාබද ඉඩම්වල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් විසින් සිදු නොකළ යුතු ය.

මාර්ග ඉදිකිරීම සඳහා කානු ආදිය විවෘතව තැබිය යුතු නම එසේ විවෘතව තැබිය හැකි බව.

37. (1) මේ පනත යටතේ පවරා ඇති බලතල යටතේ යම් ක්‍රියාවක් සිදු කිරීම සඳහා බලය ලබා දී ඇති යම් නිලධරයකු හෝ සේවකයකු විසින් එම ක්‍රියාව සිදු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් තැනැත්තකු වෙත පාඩුවක් හෝ අලාභයක් සිදු කරනු ලබයි නම්, එකී පාඩුව හෝ අලාභය සඳහා වන්දි ලැබීමට එම තැනැත්තාට හිමිකමක් තිබිය යුතු ය.

දේපළවලට සිදුවන අලාභ සඳහා බලයලත් නිලධරයන් විසින් වන්දි ගෙවිය යුතු බව.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින්, එකී උද්දේශිත අලාභය සිදු වී මාස තුනක කාලසීමාවක් ඇතුළත එකී අලාභය සඳහා වන්දි ඉල්ලමින් අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තත්කාර්ය සඳහා මෙම කාලසීමාවෙන් පසුව කරනු ලබන ඉල්ලීම සලකනු නොලැබිය යුතු ය.

(3) වන්දි මුදල් ප්‍රමාණය පිළිබඳව එකඟතාවයකට පැමිණිය නොහැකි අවස්ථාවක දී, ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පත් කරනු ලබන සමථකරුවකු විසින් සමථ කිරීම මඟින් එකී මුදල් තීරණය කරනු ලැබිය හැකි ය.

නිලධරයන්ගේ පීඩාකාරී හැසිරීම.

38. මේ පනත යටතේ වූ බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී යම් නිලධරයකු හෝ සේවකයකු පීඩාකාරී ලෙස හැසිරීම හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවනට මඟපෑදීම සිදු කරයි නම් ඔහු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට එම නිලධරයා හෝ සේවකයා යටත්විය යුතු ය.

## VII වන කොටස

### මාර්ග, මහා මාර්ග සහ ජාතික මහා මාර්ග ආරක්ෂා කිරීම

ජාතික මහා මාර්ගයකට යාබද ඉඩම්වල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන්ට එම මහා මාර්ගයට ප්‍රවේශවීමට අයිතියක් නොමැති බව.

39. (1) අධිවේගී මහා මාර්ගයක් හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති යම් ජාතික මහා මාර්ගයකට ආසන්න හෝ යාබද ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු විසින්—

(අ) එකී අධිවේගී මහා මාර්ගයට හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයට ප්‍රවේශවීමේ අයිතිය හෝ එයින් පිටවීමේ අයිතිය ;

(ආ) එකී අධිවේගී මහා මාර්ගය හෝ සීමිත ප්‍රවේශ මහාමාර්ගය සහ ඉඩම අතර ගමන් කිරීමේ අයිතිය, පාවිච්චි කිරීමේ හෝ මාර්ග අයිතිය ; සහ

(ඇ) එකී අධිවේගී මහා මාර්ගය හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයට කුමන ආකාරයකින් හෝ බලපාන්නාවූ අයිතියක් සඳහා හිමිකම් පෑම,

නොකළ යුතු ය.

(2) ජාතික මහා මාර්ගයක්, අධිකාරිය විසින් අධිවේගී මහා මාර්ගයක් හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට පෙර, (1) වන උපවගන්තිය යටතේ ප්‍රවේශවීමේ අයිතිය නොමැති වී යන අයිතිකරුට හෝ පදිංචිකරුට ස්වකීය ඉඩමට වෙනත් සුදුසු ප්‍රවේශවීමේ අයිතියක් ලබාදිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියා කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී පළමු වතාවට වරදකරුවීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩ මුදලකට ද දෙවන හෝ ඊට වැඩි වාර ගණනක් සඳහා වරද සිදුකර ඇති විට දී රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩ මුදලකට ද ඔහු යටත් විය යුතු ය.

දැනුම්දීමකින් තොරව මාර්ගයකට, මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට යාබද යම් ඉඩමක ගොඩනැගිලි ඉදිකළ නොහැකි බව.

40. (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එක් ලිත් මාසයක් ඇතුළත තම අදහස පිළිබඳව විධායක ඉංජිනේරුවරයා වෙත ලිඛිතව දැනුම්දීමකින් තොරව, කිසිම තැනැත්තකු යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් දිගේ යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ යම් තාප්පයක්, වැටක් හෝ ඉදිකිරීමක් කිරීම ආරම්භ කිරීම හෝ එවැනි ගොඩනැගිල්ලක්, වැටක් හෝ තාප්පයක් අලුත්වැඩියා කිරීම ආරම්භ කිරීම සඳහා යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් ඔස්සේ යම් තාවකාලික වැටක් හෝ ආවරණයක් තැබීම නොකළ යුතු ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ දැනුම්දීමක් කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී ප්‍රධාන ඉංජිනේරුවරයාගේ අනුමැතිය ඇතිව විධායක ඉංජිනේරුවරයා විසින් එකී ගොඩනැගිල්ල කඩා දැමීමට සැලැස්වීම හෝ එකී වැට, තාප්පය හෝ ඉදිකිරීම ගලවා ඉවත් කිරීම සහ එකී තැනැත්තාගෙන් එම ඉවත් කිරීම සඳහා වූ වියදම අයකර ගැනීම ද නීත්‍යානුකූල විය යුතු ය :

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි එවැනි කඩා දැමීමක් හෝ ගලවා ඉවත් කිරීමක් කිරීමට පෙර එහි අයිතිකරුට හෝ පදිංචිකරුට එකී කඩා දැමීම හෝ ඉවත් කිරීම පිළිබඳ ප්‍රමාණවත් පූර්ව දැනුම්දීමක් දිය යුතු ය.

තාවකාලික ආවරණ ඉදිකිරීම සඳහා අවසර ලබා ගැනීම.

41. (1) පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව යම් පුද්ගලයකුගේ තාවකාලික පදනම මත වූ සැරසීමක් ඉදිකිරීමේ අයිතිය ද ඇතුළුව, තම නිවස හෝ ගොඩනැගිල්ල කඩාබිඳ දැමීමේ, අලුත්වැඩියා කිරීමේ හෝ ඉදිකිරීමේ කටයුතු කරගෙන යෑම සඳහා

ගාස්තු ගෙවීමේ පදනම මත යම් තාවකාලික වැටක් හෝ ආවරණයක් ඉදිකිරීම සඳහා මාර්ගයේ, මහා මාර්ගයේ හෝ ජාතික මහා මාර්ගයේ යම් කොටසක් පාවිච්චි කිරීමට විධායක ඉංජිනේරුවරයා විසින් අවසර ලබාදීම නීත්‍යනුකූල විය යුතු ය :—

(අ) එසේ අවසරය ප්‍රදානය කර ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින් එකී තාවකාලික ආවරණය හෝ ඉදිකිරීම පවත්නා කල් එම පරිශ්‍රය තුළ රාත්‍රී කාලයේ ප්‍රමාණවත් ප්‍රබලතාවය ඇති ආලෝකය සපයා තිබිය යුතු ය ;

(ආ) එකී මාර්ගයේ , මහා මාර්ගයේ හෝ ජාතික මහා මාර්ගයේ රථවාහන සහ පදිකයන්ගේ ගමනාගමනයට අවහිර නොවන ලෙස ප්‍රමාණවත් ඉඩපහසුකමක් සලසා දිය යුතු ය.

(2) 40 වන වගන්තියේ හෝ 41 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් මහජන සේවයක් බෙදා හැරීමේලා සම්බන්ධවී සිටින යම් රජයේ නිලධරයකු එකී මාර්ගයේ, මහා මාර්ගයේ හෝ ජාතික මහා මාර්ගයේ යම් කොටසක් තාවකාලික ලෙස පාවිච්චි කරනු ලැබිය හැකි ය.

මාර්ගයක් මහාමාර්ගයක්, හෝ ජාතික මහාමාර්ගයක් ඔස්සේ ඇති ඉදිකිරීම සීමා නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු බව.

42. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් හෝ ඒවායේ යම් කොටසක් ඔස්සේ ඇති ඉදිකිරීම් සීමා නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක ඉදිකිරීම් සීමා නිශ්චිතව දක්වා නැති අවස්ථාවක, එකී මාර්ගයේ හෝ මහා මාර්ගයේ හෝ ජාතික මහා මාර්ගයේ ඉදිකිරීම් සීමා—

(අ) එකී ජාතික මහා මාර්ගයේ රථවාහන ගමන් කරන කොටසේ මැද සිට මීටර් පහළොවක් විය යුතු ය ;

(ආ) එකී මහා මාර්ගයේ, රථවාහන ගමන් කරන කොටසේ මැද සිට මීටර් හතයි දශම පහක් විය යුතු ය ;

(ඇ) එකී මාර්ගයේ රථවාහන ගමන් කරන කොටසේ මැද සිට මීටර් පහක් විය යුතු ය.

(3) කිසිම තැනැත්තකු විසින් නියමිත දිනයෙන් පසුව විධායක ඉංජිනේරුවරයා විසින් ප්‍රදානය කරනු ලබන අවසර පත්‍රයක අධිකාරිය යටතේ මිස ඉදිකිරීම් සීමාවක් ඇතුළත, යම් ගොඩනැගිල්ලක, ප්‍රවේශ දොරකඩක් හෝ වෙනත් යම් ඉදිකිරීමක් සිදු කිරීම හෝ ඒවාට යම් එකතු කිරීමක් හෝ නැවත ඉදිකිරීමක් සිදු කිරීම නැතහොත් පොලව යට තට්ටුවක් හෝ වෙනත් භූගත ඉදිකිරීමක් ඉදිකිරීම හෝ යම් ළිඳක්, භූගත පොකුණක්, පතල් ළිඳක් හෑරීම (මේ පනතේ මේ කොටසේ මින් මතු "ඉදිකිරීම" යනුවෙන් සඳහන් කරනු ලබන) කරනු නොලැබිය යුතු ය.

(4) (අ) විධායක ඉංජිනේරුවරයා විසින් (3) වන උපවගන්තිය යටතේ යම් ඉදිකිරීමක් කිරීම සඳහා නගර සීමාවක දී ජාතික මහා මාර්ගයක වාහන ගමන් කරන කොටසේ මැද සිට මීටර් දහයක් (10) ඇතුළත සහ නගර සීමාවෙන් පිටත මීටර් හතයි දශම පහක (7.5) සීමාව තුළ, අවසර පත්‍රයක් ප්‍රදානය නොකළ යුතු ය ;

(ආ) මෙම උපවගන්තියේ කාර්ය සඳහා ඉදිකිරීම් යන වචනය සඳහා මායිම් තාප්පයක් ඇතුළත් නොවේ ;

(ඇ) විධායක ඉංජිනේරුවරයා විසින් (අ) ඡේදයේ දක්වා ඇති සීමාව සහ ඉදිකිරීම් සීමාව අතර යම ඉදිකිරීමක් ගොඩනැගීම සඳහා (3) උපවගන්තිය යටතේ බලපත්‍රයක් ලබාදීම, එකී ඉදිකිරීම කරනු ලබන ඉඩමේ අයිතිකරුට එකී ඉදිකිරීම තහනම් කරනු ලැබුවහොත් අතිවිශාල පීඩාවක් හෝ පාඩුවක් වන බවට විධායක ඉංජිනේරුවරයා සෑහීමකට පත්වන්නේ නම් සහ එකී බලපත්‍රය ලබාදීමට විධායක ඉංජිනේරුවරයා විසින් පළාත් අධ්‍යක්ෂවරයාගෙන් ලිඛිත අවසරය ලබාගෙන ඇත්නම් හැර නොකළ යුතු ය.

එකී මාර්ගයේ, මහාමාර්ගයේ හෝ ජාතික මහා මාර්ගයේ පළල වාහන ගමනාගමනය සඳහා ඇති දෘශ්‍යමය පැහැදිලි බව, ඉඩ ප්‍රමාණය සහ මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය යථාපරිදි පවත්වාගෙන යෑම ආදිය සැලකිල්ලට ගෙන එවැනි තහනමක් ක්‍රියාත්මක කිරීම තත්කාලයේ අත්‍යවශ්‍ය

නොවන බවට සෑහීමට පත්වන්නේ නම් මිස පළාත් අධ්‍යක්ෂවරයා එවැනි අවසරයක් ලබා නොදිය යුතු ය.

(ආ) යම් ඉදිකිරීමක් ගොඩනැගීම සඳහා (3) වන උපවගන්තිය යටතේ විධායක ඉංජිනේරුවරයා විසින් ප්‍රදානය කරන සෑම අවසර පත්‍රයකම—

(i) එකී ඉදිකිරීම් සීමාව තුළ යම් ඉදිකිරීමක් හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් එකී ඉඩම (460 වන අධිකාරය වූ ) ඉඩම් පවරා ගැනීමේ පනත යටතේ පවරා ගෙන ඇත්නම් ; හෝ

(ii) ඕනෑම ආකාරයක කාර්යයක් සඳහා එකී සීමාව තුළ එම ඉදිකිරීම කඩා දැමීම හෝ ඉවත් කිරීමෙන් පසු ඉතිරිවන කොටස වැඩිදියුණු කිරීම හෝ නැවත සකස් කිරීම සම්බන්ධයෙන්,

කිසිම වන්දි මුදලක් නොගෙවීම කොන්දේසියක් විය යුතු ය.

(ඉ) යම් ඉදිකිරීමක් නැවත ඉදිකිරීමක් සඳහා හෝ අලුතින් එකතු කිරීමක් සඳහා (3) වන උපවගන්තිය යටතේ විධායක ඉංජිනේරුවරයා විසින් නිකුත් කෙරෙන බලපත්‍රය එකී ඉදිකිරීම සිදු කර ඇති ඉඩම මහජන ප්‍රයෝජනය සඳහා (460 වන අධිකාරය වූ ) ඉඩම් පවරා ගැනීමේ පනත යටතේ පවරා ගනු ලබන අවස්ථාවක දී එකී ඉදිකිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල 46 සහ 47 වන වගන්තිවල විධිවිධාන ප්‍රකාරව නිශ්චය කරනු ලැබිය යුතු බව,

කොන්දේසියක් විය යුතු ය.

(5) (අ) එකී ඉදිකිරීමේ ආගමික වැදගත්කමක් ඇති අවස්ථාවක දී පළාත් අධ්‍යක්ෂවරයාගේ අනුමතය නොමැතිව, (3) වන උපවගන්තිය යටතේ අවසරපත්‍රයක් විධායක ඉංජිනේරුවරයා විසින් ප්‍රදානය නොකළ යුතු ය.

(ආ) පළාත් අධ්‍යක්ෂවරයා විසින් (අ) ඡේදය යටතේ විධායක ඉංජිනේරුවරයා විසින් අනුමතයක් අපේක්ෂා කරනු ලබන අවස්ථාවක දී අනුමතය ප්‍රදානය කිරීමට පෙර, එකී කාරණය පිළබඳව සුදුසු විමර්ශනයක් කරනු ලැබිය යුතු ය.

(ඇ) මේ උපවගන්තිය යටතේ පළාත් අධ්‍යක්ෂවරයා විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන විටදී එකී ප්‍රතික්ෂේප කිරීම සඳහා ඔහු විසින් ලිඛිත හේතු දැක්විය යුතු ය.

(6) (අ) (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති විස්තර ද, කොන්දේසි අදාළ වන ඉඩම සහ ඉදිකිරීම සහ එහි වටිනාකම ද ඇතුළුව (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන සෑම බලපත්‍රයකම සම්පූර්ණ විස්තර විධායක ඉංජිනේරුවරයා විසින් ස්වකීය කාර්යාලයේ තබා ඇති ලේඛනයක ඇතුළත් කරනු ලැබිය යුතු ය. තව ද විධායක ඉංජිනේරුවරයා විසින් එකී ඉඩම පිහිටි බලයලත් ප්‍රදේශය තුළ වූ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එකී ලේඛනයේ ඇතුල් කරන සෑම බලපත්‍රයකම සහතික පිටපතක් ලියාපදිංචි කිරීම සඳහා කටයුතු සැලැස්විය යුතු ය. ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී සියලු පිටපත් කිසිම අය කිරීමකින් හෝ ගාස්තුකින් තොරව ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ යම් ලේඛනයක් ලියාපදිංචි කිරීමෙන් පසු එකී බලපත්‍රය හා සම්බන්ධ කොන්දේසි එකී ඉඩමට සහ ඉදිකිරීමට අදාළ විය යුතු ය. එම ඉඩමේ හෝ ඉදිකිරීමේ තත්කාලයේ අයිතිය හෝ සන්තකය දරනු ලබන තැනැත්තා එකී කොන්දේසි මගින් බැඳී සිටිය යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ විධායක ඉංජිනේරුවරයාගේ කාර්යාලයේ තබා ඇති ලේඛනය, කැමති යම් තැනැත්තකුට කාර්යාලීය කටයුතු සඳහා එම කාර්යාලය විවෘතව තබනු ලබන ඕනෑම වේලාවක දී පරීක්ෂා කර බැලීම සඳහා අවස්ථාව සලසා තිබිය යුතු ය.

ඉදිකිරීම සඳහා අනුමතය විධායක ඉංජිනේරුවරයාගේ බලපත්‍රය ලබාගැනීමෙන් පසුව පමණක් විය යුතු බව.

43. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද යම් ඉදිකිරීමක් සඳහා යම් නියෝජ්‍ය ආයතනයක හෝ අධිකාරියක අනුමතය අවශ්‍ය වන විට දී මේ පනතේ විධිවිධාන ප්‍රකාරව විධායක ඉංජිනේරුවරයා විසින් ප්‍රදානය කර ඇති බලපත්‍රයක් මගින් යම් ඉදිකිරීමක් සඳහා බලය ලබා දී ඇත්නම් මිස 42 වන වගන්තියේ

නිශ්චිතව දක්වා ඇති ඉදිකිරීම් සීමාව ඇතුළත යම් ඉදිකිරීමක් සඳහා එකී නියෝජ්‍ය ආයතනයක් හෝ අධිකාරියක් විසින් අනුමැතිය ප්‍රදානය නොකළ යුතු ය.

ඉදිකිරීම සීමා නවීකරණය කිරීම.

44. අධිකාරියේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් හෝ යම් මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක කොටසක් සම්බන්ධයෙන් වූ ඉදිකිරීම් සීමා නවීකරණය කිරීම හෝ පුළුල් කිරීම කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, අධිකාරිය හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී නිර්දේශ කිරීමට පෙර, මහජනතාවගේ පහසුව ද ප්‍රදේශයේ පොදු පහසුකම් ආරක්ෂා කිරීමේ සහ දිගටම පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවය ද යෝජිත වෙනස් කිරීම් හෝ ව්‍යාප්ත කිරීම මගින් මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මහාමාර්ගය නැතහොත් මාර්ගයේ හෝ මහා මාර්ගයේ හෝ ජාතික මහා මාර්ගයේ යම් කොටසක් සංවර්ධනය කිරීම, හැරවීම, වෙනස් කිරීම හෝ පුළුල් කිරීම සඳහා වූ යෝජිත යම් වැඩ සටහනක වියදම වැඩි නොවන බවට වගබලා ගැනීම සම්බන්ධයෙන් ද සැලකිල්ලට ගත යුතු ය.

42 වන වගන්තිය උල්ලංඝනය කරමින් ඉදිකිරීම සිදු කරනු ලබන අවස්ථාවල දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය.

45. (1) 42 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු විසින් යම් ඉදිකිරීමක් සිදු කරයි නම් හෝ යම් පවත්නා ඉදිකිරීමකට අලුතින් එකතු කිරීමක් සිදු කරනු ලබයි නම්, විධායක ඉංජිනේරුවරයා විසින් ලිඛිත නිවේදනයක් මගින් එම නිවේදනය සිදු කරන දින සිට දින හතකට අඩු නොවන නිශ්චිතව සඳහන් යම් දිනයකට හෝ ඊට පෙර එකී ඉදිකිරීම හෝ එම අලුතින් එකතු කිරීම කඩා බිඳ දමන ලෙස හෝ ඉවත් කරන ලෙස එම තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් නිවේදනයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින් එම නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත දී හෝ තත්කාර්ය සඳහා තමා විසින් ඉල්ලා සිටීමේ දී විධායක ඉංජිනේරුවරයා විසින් දීර්ඝ කරන ලද යම් කාලසීමාවක් ඇතුළත එකී නිවේදනයේ නියමයන්ට එකඟව කටයුතු කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(3) (අ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නිවේදනයක පරිදි යම් ඉදිකිරීමක් අවස්ථාවෝචිත පරිදි අදාළ කාලසීමාව ඇතුළත කඩාබිඳ දමා හෝ ඉවත් කර නොමැති අවස්ථාවක දී විධායක ඉංජිනේරුවරයා විසින් එකී ඉදිකිරීම කඩාබිඳ දැමීම හෝ ඉවත් කිරීමට සැලැස්වීම සඳහා තමාට බලය ලබාදෙන්නා වූ විධානාත්මක ආඥාවක් ලබා ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) මහෙස්ත්‍රාත්වරයා විසින් පවත්නා කරුණු අනුව තමා සෑහීමට පත් වන්නේ නම් (1) වන උපවගන්තිය යටතේ විධායක ඉංජිනේරුවරයා විසින් නිකුත් කරන ලද නිවේදනයේ වූ නියමයන්ට එකඟව ක්‍රියා කිරීම පැහැර හැර ඇති එකී තැනැත්තා වෙත ද නිවේදනයක් නිකුත් කර, විධායක ඉංජිනේරුවරයා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම පරිදි, එකී ඉදිකිරීම කඩාබිඳ දැමීමට හෝ ඉවත් කරන ලෙසට ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(ඇ) එකී ඉදිකිරීම කඩාබිඳ දැමීමට හෝ ඉවත් කිරීමට 42 වන වගන්තිය උල්ලංඝනය කරමින් ඉදිකිරීම සිදු කරනු ලබන එකී තැනැත්තා විසින් භාරගනු ලබන්නේ නම්, එකී ඉදිකිරීම කඩාබිඳ දැමීම හෝ ඉවත් කිරීම එකී තැනැත්තා විසින් සිදු කිරීම සඳහා, මහෙස්ත්‍රාත්වරයා විසින් යෝග්‍ය යයි සලකනු ලබන්නේ නම්, තමා විසින් නිකුත් කරන ලද ආඥාව ක්‍රියාත්මක කිරීම දින හැටකට වැඩි නොවන කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(4) (අ) (3) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ යම් ආගමික වැදගත්කමක් ඇති ඉදිකිරීමක් කඩාබිඳ දැමීම හෝ ඉවත් කිරීම සඳහා විධානාත්මක ආඥාවක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී සහ එකී ඉදිකිරීම සුරක්ෂිත ලෙස ඉවත් කරනු ලැබිය හැකි අවස්ථාවක දී, (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට යටත්ව එකී ඉදිකිරීම සඳහා වගකිව යුතු සංවිධානයකට හෝ ආයතනයකට එකී ඉදිකිරීම ඉවත් කරනු ලැබ භාර දෙනු ලැබිය යුතු ය.

(ආ) යම් ඉදිකිරීමක් (අ) ඡේදයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි භාර දීමට විධායක ඉංජිනේරුවරයාට අපහසුවන අවස්ථාවක දී, ඔහු විසින් ඒ පිළිබඳව මහෙස්ත්‍රාත්වරයාගේ උපදෙස් අනුව නිසි ගෞරවය සහ සැලකිල්ල සහිතව එකී ඉදිකිරීම බැහැර කරනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ විධානාත්මක ආඥාවක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී ආඥාවක් ක්‍රියාත්මක කිරීම සඳහා විධායක ඉංජිනේරුවරයා වෙත අවශ්‍ය සියලු සහාය ලබාදීම පොලිසියේ කාර්යය විය යුතු ය.

(6) (3) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් කරන ලද ආඥාවක් අනුව ක්‍රියාකිරීමේ දී යම් ඉදිකිරීමක් කඩාබිඳ දැමීමට හෝ ඉවත් කිරීම සඳහා විධායක ඉංජිනේරුවරයා විසින් දරන ලද යම් සාධාරණ වියදමක් අයකර ගැනීම සඳහා විධායක ඉංජිනේරුවරයාට හිමිකම තිබිය යුතු ය.

ගොඩනැගිලි සහිත ඉඩම සම්බන්ධයෙන් වන්දි මුදල් තීරණය කිරීම.

46. 42 වන වගන්තිය යටතේ වූ බලපත්‍රයක අධිකාරිය යටතේ ඉදිකරන ලද යම් ඉදිකිරීමකට අලුතින් එකතු කිරීමක්, පනතේ 15 වන වගනතියේ හෝ 18 වන වගන්තිය යටතේ මහජන ප්‍රයෝජනය සඳහා සතු කරගනු ලබන ඉඩමක යම් කොටසක පිහිටා ඇති අවස්ථාවක දී ගෙවිය යුතු වන්දි මුදල් තීරණය කිරීම (460 වන අධිකාරය වූ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද පහත දැක්වෙන විධිවිධානවලට යටත්ව විය යුතු ය :—

(අ) සම්පූර්ණ ඉදිකිරීම, ඉදිකිරීම් සීමාව ඇතුළත පිහිටි අවස්ථාවක, අත්කරගත් ඉඩමට ලබා ඇති වටිනාකමට අමතරව ඉදිකිරීමට ලබා දී ඇති වටිනාකම වනුයේ 42 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යන ලේඛනයේ ඉදිකිරීම සඳහා ඇතුළත් කර ඇති වටිනාකම හෝ අත්කරගන්නා අවස්ථාවේ දී, ඉදිකිරීමේ දී වෙළෙඳපොළ වටිනාකම යන දෙකෙන් වඩා අඩු වටිනාකම විය යුතු අතර, ඉහත කී කාර්ය සඳහා අත්කර ගන්නා අවස්ථාවේ වෙළෙඳපොල වටිනාකම විය යුත්තේ එවකට ඉඩම සහ ඉදිකිරීමේ යන දෙකෙහි වෙළෙඳපල වටිනාකම සහ එවකට ඉඩමේ වෙළෙඳපල වටිනාකම අතර ඇති වෙනස විය යුතු ය ;

(ආ) ඉදිකිරීමෙන් කොටසක් පමණක් ඉදිකිරීම් සීමාව අතුළත පිහිටා ඇති අවස්ථාවක සහ 42 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ ලේඛනයේ ඇතුළත් කර ඇති වටිනාකම 47 (2) (අ) වගන්තියට අනුකූලව සම්පූර්ණ

ඉදිකිරීමේ වටිනාකම වන අවස්ථාවක, අත්කරගත් ඉඩමට අමතරව ඉදිකිරීමේ කොටසට ලබා දී ඇති වටිනාකම වනුයේ එසේ ඇතුළත් කළ වටිනාකම හෝ අත්කර ගත් අවස්ථාවේ දී සම්පූර්ණ ව්‍යුහයේ වෙළෙඳපල වටිනාකම යන දෙකෙන් වඩා අඩු වටිනාකම වන අතර ඉහත කී කාර්ය සඳහා වෙළෙඳපල වටිනාකම වනුයේ ඉඩම සමඟ ඉදිකිරීමේ වෙළෙඳපල වටිනාකම සහ ඉදිකිරීමෙන් වෙන්ව එකී ඉඩමේ වටිනාකම අතර වෙනස විය යුතු ය ;

(ඈ) ඉදිකිරීමෙන් කොටසක් පමණක් ඉදිකිරීම් සීමාව ඇතුළත පිහිටා ඇති අවස්ථාවක සහ 42 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ ඇතුළත් කර ඇති වටිනාකම 47 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයට අනුකූලව එම කොටසේ වටිනාකම වන අවස්ථාවක අත්කරගත් ඉඩමට වඩා වෙනස් වූ ඉදිකිරීම් සීමාව ඇතුළත පිහිටි ඉදිකිරීමේ කොටසේ වටිනාකම යන දෙකෙන් වඩා අඩු වටිනාකම වන අතර, ඉහත කී කාර්ය සඳහා එම වටිනාකම වනුයේ—

(i) එම අවස්ථාවේ දී ඉදිකිරීමේ එම කොටස ගලවා දැමීමේ සහ ඉවත් කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය ; සහ

(ii) ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වන විට ගොඩනැගිල්ල එම අවස්ථාවේ දී භාවිතා කරනු ලබන කාර්ය සඳහා ඉතිරිව ඇති කොටස සකස් කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය වන අතර, තාප්පයක් හෝ ගේට්ටුවක් සම්බන්ධයෙන් වන විට අවශ්‍ය වන එකතු කිරීම් හෝ අලුත්වැඩියා කිරීම අවසන් කිරීමේ වියදම වේ.

(ඇ) යම් ඉඩමක් මත ඇති ගොඩනැගිලිවලට වෙනස්ව ඉඩමට වෙන්කර දී ඇති වටිනාකම වනුයේ අත්කරගන්නා අවස්ථාවේ දී ඉඩමේ වෙළෙඳපල වටිනාකම වේ.

ඉදිකිරීම සීමා ඇතුළත ගොඩනැගිලි ආදිය තක්සේරු කිරීම.

47. (1) 42 වන වගන්තියේ (4) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් ඉදිකිරීමක වටිනාකම—

(අ) ප්‍රධාන ඉංජිනේරුවරයා සහ ඉදිකිරීමේ අයිතිකරු හෝ අයිතිකරුවන් අතර ගිවිසුමක් මගින් නියම කරනු ලැබිය යුතු ය ; හෝ

(ආ) එය ගිවිසුමක් මගින් නියම කර නැති අවස්ථාවක දී එය තීරණය කරනු ලැබිය යුත්තේ පළාත් අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන බේරුම්කරුවකු විසින් තීරණය කරනු ලබන පරිදි වේ.

(2) 42 වන වගන්තියේ (4) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් ඉදිකිරීමක හෝ එහි කොටසක වටිනාකම තීරණය කිරීමේ දී පහත දැක්වෙන ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු ය :—

(අ) යම් ඉදිකිරීමක් හෝ එහි කොටසක් ඉවත් කිරීමෙන් එහි ඉතිරි කොටස ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්වන අවස්ථාවක එම ඉදිකිරීම පිහිටා ඇත්තේ යම් මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක ඉදිකිරීම් සීමාව ඇතුළත වන අවස්ථාවක දී එම හේතුව නිසා එම මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය පුළුල් කිරීමේ දී හෝ වෙනස් කිරීමේ දී සම්පූර්ණ ඉදිකිරීම් ඉවත් කිරීම අවශ්‍ය වන අවස්ථාවක, සම්පූර්ණ ඉදිකිරීමේ වටිනාකම තීරණය කරනු ලැබිය ලැබිය යුතු අතර, එම වටිනාකම තක්සේරු කරන අවස්ථාවේ පරිශ්‍රයේ වෙළෙඳපල වටිනාකම, ඉදිකිරීම සහ ඊට අදාළ ඉඩමේ වටිනාකම සහ ඉඩමේ වෙළෙඳපල වටිනාකම අතර ඇති වෙනස වේ ;

(ආ) ඉදිකිරීමක යම් කොටසක් පමණක් යම් මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක ඉදිකිරීම් සීමාව ඇතුළත පිහිටා ඇති අවස්ථාවක සහ එම කොටස වෙන් කිරීමෙන් හෝ ඉවත් කිරීමෙන් පසු එම ඉදිකිරීම එහි මුල් කාර්යය සඳහා හෝ නීතිය මගින් අවසර දෙනු ලබන වෙනත් කාර්යයක් සඳහා යොදා ගත හැකි වන අවස්ථාවක, ඉදිකිරීම් සීමාව ඇතුළත පිහිටි කොටසේ වටිනාකම පමණක් තීරණය කරනු ලැබිය යුතු අතර, එම වටිනාකම වනුයේ—

(i) ඉදිකිරීමේ එම කොටසේ ගලවා දැමීමේ සහ ඉවත් කිරීමේ ඇස්තමේන්තුගත වියදමේ ; සහ

(ii) ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වන විට ගොඩනැගිල්ලේ ඉතිරිව ඇති කොටස ගොඩනැගිල්ල භාවිතා කරනු ලැබූ කාර්යය සඳහා

සුදුසු පරිදි යෝග්‍ය ලෙස යොදා ගැනීම සඳහා තක්සේරු කරන ලද අවස්ථාවේ දී දරන ලද වියදම් සහ මායිම් තාප්පයක්, ගේට්ටුවක් එවැනි වෙනත් ඉදිකිරීමක් හෝ පොළව යට තට්ටුවක් හෝ වෙනත් පොළව යට ඉදිකිරීමක් හෝ පොකුණක්, ළිඳක් හෝ පතල් ළිඳක් වන විට එවැනි එකතු කිරීම හෝ අලුත්වැඩියා කිරීම් සඳහා ඇස්තමේන්තු වියදම,

ආදියේ මුළු එකතුව විය යුතු ය.

(ඇ) යම් ඉදිකිරීමක් වටිනාකම තක්සේරු කරන අවස්ථාවේ දී එම ඉදිකිරීමට කරන ලද වෙනස් කිරීමක් හෝ වැඩිදියුණු කිරීමක් නිසා එම ඉදිකිරීමේ වටිනාකම වැඩිවී ඇති බවට තීරණය කරනු ලබන අවස්ථාවක, එවිට 42 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් මගින් එම වෙනස් කිරීමට හෝ වැඩිදියුණු කිරීමට බලය පවරා තිබීම නොතකා, ඉදිකිරීම නිසි පරිදි අලුත්වැඩියා කර නඩත්තු කිරීම සඳහා වෙනස් කිරීම් හෝ වැඩිදියුණු කිරීම් අවශ්‍ය වන්නේ නම් මිස, එකී වැඩිවීමේ ප්‍රමාණය සැලකිල්ලට නොගත යුතු ය.

(3) යම් ඉදිකිරීමක් හෝ එහි කොටසක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි සිදු කරන ලද සෑම ප්‍රදානයක් හෝ ඇතුළත් වූ සෑම ගිවිසුමක්ම ඉහත කී වටිනාකම නියම කළ හෝ තීරණය කරනු ලැබුවේ (2) වන උපවගන්තියේ කවර ඡේදය යටතේ ද යන්න නිශ්චිතව දැක්විය යුතු ය.

ඉදිකිරීම් සීමාවෙන් බලපෑම් වූ ඉඩම් අයිතිකරු සඳහා යාබද ඉඩම් අත්කර ගැනීම.

48. (1) යම් මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක ඉදිකිරීම් සීමා ඇතුළත කොටසක් පිහිටි යම් ඉඩමක අයිතිකරුට, ඒ ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ඇති අයිතිය 42 වන වගන්තියේ විධිවිධාන හේතුවෙන් සීමා කෙරෙන අවස්ථාවක, ඒ අයිතිකරු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට බලාපොරොත්තු වන්නේ නම්, 45 වන වගන්තියේ විධිවිධාන බලාත්මකව නොපැවතියේ නම් ඔහු විසින් ගොඩනගනු ලැබිය හැකිව තිබුණු ස්වභාවයේම ගොඩනැගිල්ලක් තැනීමට පහසුකම් ඇති ප්‍රමාණවත් විශාලත්වයෙන් යුත් හිස් ඉඩමක් ඔහුගේ ඉඩම පිටුපසින් තිබේ නම්, එකී හිස් ඉඩම ඔහුගේ වියදමින් ඔහු උදෙසා අත්කර ගන්නා ලෙස එකී අයිතිකරු විසින් අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන විමසීමකින් පසුව සහ අධිකාරිය හෝ අධිකාරිය විසින් පවරන ලද බලතල අනුව ක්‍රියා කරන අධිකාරියේ අධ්‍යක්ෂ

ජනරාල්වරයාගේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින් ඒ අයිතිකරුගේ ඉඩමට පිටුපසින් ඇති හිස් ඉඩමෙන් නිශ්චිතව සඳහන් කරනු ලබන ප්‍රමාණයක් ඒ අයිතිකරු වෙනුවෙන් අත්කරගනු ලැබිය යුතු බවට නියම කරනු ලැබිය හැකි අතර, පනතේ 15 සහ 18 වන වගන්තිවල විධිවිධාන එකී ඉඩම් කොටස අත්කරගැනීමේ කාර්ය සඳහා ඒ අනුව අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් ප්‍රකාරව යම් ඉඩම් කොටසක් අත්කරගැනීමේ දී දරන ලද සියලු පිරිවැය, ගාස්තු සහ වෙනත් වියදම් එකී ඉඩම් කොටස අවශ්‍ය බවට ඉල්ලීම කරන ලද අයදුම්කරු විසින් ගෙවනු ලැබිය යුතු ය.

42 වන වගන්තියේ සිට 48 වන වගන්තිය දක්වා වූ වගන්තිවල විධිවිධාන අදාළ වීම.

49. (1) 42 වන වගන්තියේ සිට 48 වන වගන්තිය දක්වා වූ වගන්තිවල කාර්ය සඳහා, යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් අධිකාරිය විසින් ලබාදෙන ලද අරමුදල් මගින් අධිකාරිය විසින් නඩත්තු කරනු ලබයි නම්, එම මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය අධිකාරියේ පාලනය යටතේ වන බවට සලකනු ලැබිය යුතු ය. යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් අධිකාරියේ පාලනය යටතේ වන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද යම් සහතිකයක් සාක්ෂියක් වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, එම කාරණය සඳහා එය බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(2) 42 වන වගන්තියේ සිට 48 වන වගන්තිය දක්වා වූ වගන්තිවල කාර්ය සඳහා "මායිම් තාප්පය" යන යෙදුමට මායිම් තාප්පයක කාර්ය සිදුකරන හෝ සිදුකරනු ලබන බවට අදහස් කරන ඕනෑම අමුද්‍රව්‍යයකින් සහ ඕනෑම ආකාරයකට ඉදිකරන ලද සෑම ඉදිකිරීමක්ම සහ ඕනෑම විස්තරයකට අයත් සෑම වැටක්ම ඇතුළත් වේ.

යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් වෙත බාධා ඇති කිරීම, බලෙන් අල්ලා ගැනීම ආදිය.

50. (1) යම් තැනැත්තකු විසින්—

(අ) යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් අවහිර කර ඇති බව හෝ බලෙන් අල්ලාගෙන ඇති බවට ; හෝ

(ආ) යම් මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක මායිම් රේඛාව නිසි බලයකින් තොරව වෙනස් කරනු ලැබ ඇති බවට ; හෝ

(ඇ) යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් සඳහා නිසි බලයකින් තොරව මාර්ග බාධක පමුණුවා ඇති බවට,

විධායක ඉංජිනේරුවරයාට පෙනී යන්නේ නම්, තමා විසින් නිවේදනයක නිශ්චිතව දැක්වෙන කාලයක් ඇතුළත වහාම එකී අවහිරය බලෙන් ඇල්ලීම, වෙනස් කිරීම හෝ බාධකය ඉවත් කරන ලෙස එකී තැනැත්තා වෙත ලිඛිත නිවේදනයක් මගින් විධාන කරනු ලැබිය හැකි ය.

(2) එකී අවහිරය බලෙන් අල්ලා ගැනීම, වෙනස් කිරීම හෝ බාධකය ඉවත්කර නොමැති අවස්ථාවක සහ විධායක ඉංජිනේරුවරයා විසින් නිශ්චිතව දක්වන ලද කාලසීමාව ඇතුළත එකී මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය යථා තත්ත්වයට පත් නොකර ඇත්නම් හෝ මායිම් රේඛාව යථා තත්ත්වයට පත්කර නොමැති නම්, විධායක ඉංජිනේරුවරයා විසින් අවස්ථාවෝචිත පරිදි එකී අවහිරය, බලෙන් අල්ලා ගැනීම, බාධකය හෝ වෙනස් කිරීම, ඉවත් කිරීමට, පැහැදිලි කිරීමට, යථා තත්ත්වයට පත් කිරීම සඳහා කටයුතු සැළැස්විය යුතු ය. එසේ කිරීමේ දී විධායක ඉංජිනේරුවරයා විසින් දරන ලද යම් වියදමක් එකී වරදකරුගෙන් රජයට අයවිය යුතු ණය මුදලක් ලෙස අයකරගනු ලැබිය යුතු ය.

(3) ඉදිරිපත් වන හෝ ඉදිරිපත් විය හැකි යම් බාධකයක් හෝ විරෝධය පෑමක් හේතුවෙන් විධායක ඉංජිනේරුවරයා විසින් අවස්ථාවෝචිත පරිදි යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් යම් අවහිරයක්, බලෙන් අල්ලා ගැනීමක්, බාධකයක් හෝ වෙනස් කිරීමක් ඉවත් කිරීම හෝ පැහැදිලි කිරීම හෝ යථාතත්වයට පත් කිරීම සඳහා තමා හට නොහැකි හෝ එසේ නොහැකිවනු ඇතැයි හැඟී යන අවස්ථාවක දී විධායක ඉංජිනේරුවරයා විසින් එකී බාධා කරන ලද, බලෙන් අල්ලා ගන්නා ලද, අවහිර කරන ලද හෝ වෙනස් කරන ලද මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය පිහිටා ඇති ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත අවස්ථාවෝචිත පරිදි එකී බාධකය, බලෙන් අල්ලා ගැනීම, අවහිරය හෝ වෙනස් කිරීම් පිස්කල්වරයා විසින් අත්කරගෙන ඉවත් කිරීම, පැහැදිලි කිරීම හෝ යථා තත්ත්වයට පත් කිරීම සඳහා විධාන කරන අධිකරණ ආඥාවක් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) මහෙස්ත්‍රාත්වරයා විසින් පිස්කල් වෙත (3) වන උපවගන්තිය යටතේ ආඥාවක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඔහු විසින් වහාම එකී ආඥාව ක්‍රියාවේ යෙදවිය යුතු අතර, එකී ආඥාව ක්‍රියාත්මක කළ ආකාරය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ද සමඟ එකී කාරණය අධිකරණය වෙත ඉන්පසුව ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු ය.

මැනීම බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු බව.

51. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධිකාරිය යටතේ කරන ලද යම් සැලසුමක් හෝ මැනීමක් සාක්ෂියක් වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, එහි සඳහන් කරුණු පිළිබඳව බැලූ බැල්මට පෙනෙන ඔප්පු කිරීමක් ලෙස සැලකිය යුතු ය.

රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීම) පනතේ විධිවිධාන අදාළ වීම.

52. 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීම) පනතේ විධිවිධාන, මේ පනත අදාළ වන යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් සඳහා, අදාළ කර ගැනීමේ කාර්ය සඳහා—

(අ) මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද සෑම ලිඛිත නිවේදනයක් ම, 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීම) පනතේ 3 වන වගන්තිය යටතේ භාරදෙන ලද දැන්වීමක් විය යුතු බවට සලකනු ලැබිය යුතු ය ;

(ආ) 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීම) පනතේ "නිසි බලධරයා" යන යෙදුමට අවස්ථාවෝචිත පරිදි මේ පනතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, පළාත් අධ්‍යක්ෂවරයා, ප්‍රධාන ඉංජිනේරුවරයා හෝ විධායක ඉංජිනේරුවරයා ද ඇතුළත් වන බව සැලකිය යුතු ය ;

(ඇ) 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීම) පනතේ "රජයේ ඉඩම" යන යෙදුමට මේ පනත අදාළ වන සෑම මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් සම්බන්ධයෙන් කරනු ලබන සඳහන් කිරීමක් ඇතුළත් වන බවට සලකනු ලැබිය යුතු ය.

යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් සඳහා අවශ්‍ය වන ඉඩම් සඳහා කාලාවරෝධ ආඥාපනත අදාළ නොවිය යුතු බව.

53. (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන මත සන්තකය දැරීම හෝ භාවිතා කිරීම ප්‍රකාරව අයිතිවාසිකම් අත්කර ගැනීමට අදාළ වන විධිවිධාන මාර්ගවලට, මහා මාර්ගවලට හෝ ජාතික මහා මාර්ගවලට අදාළ නොවිය යුතු අතර, මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් සම්බන්ධයෙන් අයිතිය, සන්තකය හෝ භාවිත කිරීම කෙරෙහි වූ කිසිදු සුවිශේෂ අයිතියකට, කිසිම තැනැත්තකුට හිමිකම නොතිබිය යුතු ය.

54. (1) යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් බාධාවකින් හෝ අපහසුතාවයකින් තොරව භාවිත කිරීම සඳහා මහජනතාවට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා සලසාදීම සහ එකී අයිතිය ආරක්ෂා කර දීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් භාවිත කිරීම සඳහා වූ අයිතිය ආරක්ෂා කිරීම.

(2) යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් තාවකාලිකව හෝ ස්ථිරව වසාදැමීම හෝ ඊට අවහිර කිරීම හැකිතාක් දුරට වළක්වාලීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

55. (1) නීත්‍යනුකූල බලයක් හෝ නිදහසට කරුණක් නොමැතිව—

යම් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයකට අලාභහානි කිරීම වරදක් විය යුතු බව.

(අ) රථවාහන ගමන් කරන කොටසකින් සමන්විත යම් මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක කිසියම් කොටසක කාණුවක් කණින හෝ වෙනත් යම් කැණීමක් සිදු කරන; හෝ

(ආ) විධායක ඉංජිනේරුවරයාගේ හෝ ප්‍රධාන ඉංජිනේරුවරයාගේ එකඟත්වය ඇතිව මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය වැඩි දියුණු කිරීමේ කාර්ය සඳහා හැර, මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක කිසියම් කොටසකින් පස් හෝ තණ පිඩැලි ඉවත් කරන ; හෝ

(ඇ) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක අලාභහානි සිදු කරමින් ඒ මත ගිනි අවුලන හෝ ඊට යම් ද්‍රව්‍යයක් හලනු ලබන ; හෝ

(ඈ) වාහනයක ඉවතට විහිදී ඇති කොටසකින් මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක වාහන ගමන් කරන කොටසට අලාභහානි සිදුවන ආකාරයෙන් වාහනයක් ධාවනය කරන,

සෑම තැනැත්තකුම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී පළමු වරද සම්බන්ධයෙන් වන විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ද දෙවන හෝ තදනන්තර

වරදක දී වරදකරු කිරීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට ද වරද කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය.

(2) මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් මත හෝ ඒ උඩින් සවිකර ඇති රථ ගමනාගමන සලකුණක්, රථ ගමනාගමන සංඥාවක් හෝ මාර්ගයකට, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක එලෙස සවිකර ඇති කි. මී. කණුවක් හෝ පහන් කණුවක් හෝ දිශාව පෙන්වීමේ කණුවක් හෝ එවැනි වෙනත් යම් උපකරණයක් හෝ උපක්‍රමයක් වෙත නීත්‍යානුකූල බලයක් හෝ අවසරයක් නොමැතිව අලාභහානි කරන, කඩා දමන හෝ වෙනස් කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී පළමුවන වරද සම්බන්ධයෙන් වන විට රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට ද දෙවන හෝ තදනන්තර වරද සම්බන්ධයෙන් වන විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යන එක් එක් දිනයක් සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය.

නීත්‍යානුකූල නිදහසට කරුණක් නොමැතිව මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක පිත්තාරු කිරීම ආදිය වරදක් බව.

56. (1) විධායක ඉංජිනේරුවරයාගේ පූර්ව එකඟත්වය නොමැතිව හෝ සාධාරණ නිදහසට කරුණක් නොමැතිව යම් පින්තූරයක්, අකුරක්, සළකුණක්, පිළිමයක්, දැන්වීම් පුවරුවක් හෝ වෙනත් යම් සළකුණක් මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක රථ ධාවන මාර්ගයක් මත හෝ මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් මත හෝ කිසියම් මාර්ග භාණ්ඩයක් මත පින්තාරු කරන හෝ කැටයම් කරන හෝ අලවන හෝ සාදන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී පළමුවන වරද සම්බන්ධයෙන් වන විට රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට ද දෙවන හෝ තදනන්තර වරද කිරීම සම්බන්ධයෙන් වන විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් පන් දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් පින්තූරයක්, අකුරක්, සංඥාවක්, පිළිමයක්, දැන්වීම් පුවරුවක්, දැන්වීමක් හෝ වෙනත් යම් සළකුණක් විධායක ඉංජිනේරුවරයා විසින් ඉවත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් මත තාවකාලික බර සීමා කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පැනවිය හැකි බව.

57. (1) මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් පාවිච්චි කරන්නන්ගේ ආරක්ෂාව සැලකිල්ලට ගෙන යම් මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක් මත හෝ මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක කොටසක් මත හෝ පාලමක් මත ගෙන යා හැකි බර සීමා කිරීම් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී පළමු වතාවට වරදකරුවීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට ද දෙවන හෝ තදනන්තර වරද කිරීම සම්බන්ධයෙන් රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට ද යටත් විය යුතු ය.

කැණීම ආදියෙන් පදික මාර්ගයට අලාභහානි වීම සහ බාධාකිරීම.

58. (1) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක පදික මාර්ගයට—

(අ) එකී මාර්ගයේ, මහා මාර්ගයේ හෝ ජාතික මහා මාර්ගයේ යාබද ඉඩමේ යම් කැණීමකින් හෝ එහි අතුරු ඵලයක් වශයෙන්; හෝ

(ආ) එකී මාර්ගයට, මහා මාර්ගයට හෝ ජාතික මහා මාර්ගයට වාහනයක් පැදවීම මගින්,

යම් අලාභහානියක් සිදුවුවහොත් විධායක ඉංජිනේරුවරයා විසින් වහාම එම අලාභහානිය අළුත්වැඩියා කර එසේ කිරීමේ දී තමා විසින් සාධාරණ ලෙස දරන ලද වියදම් ප්‍රශ්නයට අදාළ ඉඩමේ අයිතිකරුගෙන් හෝ අලාභහානි සිදු කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තාගෙන් අයකර ගත යුතු ය.

(2) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක, පදික මාර්ගයක වාහනයක් නතරකර තැබීමෙන් අවහිර කරන ලද්දේ නම්, එසේ නතර කිරීම සඳහා වගකිව යුතු තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී

රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට ද දෙවන හෝ තදනන්තර වරද සම්බන්ධයෙන් වන විට රුපියල් පනස් දහස නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය.

මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් අවහිර කිරීම වරදක් බව.

59. (1) නීත්‍යනුකූල බලයක් හෝ නිදහසට සාධාරණ කරුණක් නොමැතිව, මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් ඔස්සේ වාහන ගමන් කිරීමට හෝ මඟී ගමනාගමනයට හිතාමතාම කිසියම් ආකාරයකින් අවහිර කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී පළමුවන වරද සම්බන්ධයෙන් වන විට රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට ද දෙවන හෝ තදනන්තර වරද සම්බන්ධයෙන් වන විට රුපියල් පනස් දහස නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන ඕනෑම තැනැත්තකු පොලිස් නිලධරයකු විසින් වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගනු ලැබිය හැකි ය.

මාර්ගයකට, මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට වැලි, දැව යනාදිය දැමීම වරදක් බව.

60. යම් මාර්ගයකට, මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට නීත්‍යනුකූල බලයක් හෝ නිදහසට කරුණක් නොමැතිව වැලි, ගල්, දැව හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් දමනු ලබන ඕනෑම තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු පළමුවතාවට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ද දෙවන හෝ තදනන්තර වරද සම්බන්ධයෙන් වන විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු වරද දිගටම සිදු කරනු ලබන විට දී එසේ වරද දිගටම සිදුකරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන් දහසක දඩයකට ද ඒ තැනැත්තා යටත් විය යුතු ය.

වැලි, ගල්, ලී ආදිය ඉවත් කිරීම.

61. (1) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක මාර්ග අයිතිය ඇතුළත දමා ඇති වැලි, ගල්, ලී හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් ඉවත් කරන ලෙස හෝ වෙනත් තැනකට දමන ලෙස හෝ මාර්ගයෙන්, මහා මාර්ගයෙන් හෝ ජාතික මහා මාර්ගයෙන්

ඈත වෙන තැනකට දැමීමට සලස්වන ලෙස, එසේ දමා ඇති ද්‍රව්‍යයේ අයිතිකරුට විධායක ඉංජිනේරුවරයා හෝ පොලිස් නිලධරයකු විසින් නියම කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් වැලි, ගල්, ලී හෝ වෙනත් ද්‍රව්‍ය ඉවත් කරන ලෙස සහ වෙන තැනක දමන ලෙස නියම කරනු ලැබූ තැනැත්තකු විසින් දින තුනක කාලයක් තුළ දී ඒ නියමය අනුව ක්‍රියාකළ යුතු අතර, එසේ කිරීම ඔහු විසින් පැහැර හැරියහොත්, ඔහු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී පළමුවන වරද සම්බන්ධයෙන් වන විට රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යන විට දී එසේ වරද නොකඩවා කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් පන් දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ දක්වා ඇති නියම අනුව ක්‍රියා කරමින් වැලි, ගල්, ලී හෝ ඒ වෙනත් යම් ද්‍රව්‍ය ඉවත් කිරීම අයිතිකරු විසින් පැහැරහරින ලද අවස්ථාවක, පොලිස් නිලධරයකුගේ සහාය ඇතිව ඒ ද්‍රව්‍ය මාර්ගයෙන්, මහා මාර්ගයෙන් හෝ ජාතික මහා මාර්ගයෙන් පිටත පිහිටි සුදුසු ස්ථානයකට ඉවත් කිරීමට විධායක ඉංජිනේරුවරයා විසින් කටයුතු සැලැස්වීම සහ ඉවත් කිරීමේ වියදම අයිතිකරුට වැය බරක් කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

මාර්ගයක රථ වාහන ගමන් කරන කොටස තුළ හෝ ඒ අසළ ගස් පඳුරු සිටුවීම සීමා කිරීම.

62. (1) නීත්‍යනුකූල බලයක් හෝ නිදහසට කරුණක් නොමැතිව මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක වාහන ගමන් කරන කොටසේ මාර්ග බෙදුම් තීරයක, මාර්ග උරහිසක හෝ පදික මාර්ගයක ගසක් හෝ පඳුරක් සිටවන සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී පළමුවන වරද සම්බන්ධයෙන් වනවිට රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය.

(2) විධායක ඉංජිනේරුවරයා විසින් ඒ ගස හෝ පඳුර සිට වූ තැනැත්තාට දින තුනක් ඇතුළත එය ඉවත් කරන ලෙස නියම කිරීම හෝ එය ඉවත් කිරීමට සැලැස්වීම නීත්‍යනුකූල විය යුතු ය.

ගස්, පඳුරු තණකොළ පැල රෝපණය කිරීමට විධායක ඉංජිනේරුවරයා විසින් අවසර දිය හැකි බවට.

63. (1) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක වට රවුමක් තුළ හෝ බෙදුම් තීරයක් තුළ හෝ මාර්ග උරහිසක් දිගේ හෝ පඳුරු, ගස්, තණකොළ සහ පැල රෝපණය කර නඩත්තු කිරීමට විධායක ඉංජිනේරුවරයා විසින් යම් තැනැත්තකුට අවසර දෙනු ලැබිය හැකි ය. වාහන සහ පදික ගමනාගමනය, ගමන් කරන වාහනවල ආරක්ෂාව සහ රියදුරන්ට මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය දර්ශනය වීම සැලකිල්ලට ගනිමින් නියම කරනු ලබන උසකට පමණක් එම ගස්, පඳුරු සහ පැළ රෝපණය කළ යුතු බවට වූ කොන්දේසියකට යටත්ව ඒ අවසරය දෙනු ලැබිය යුතු ය.

(2) මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් දිගේ නිශ්චිත ප්‍රදේශයක ගස් වැවීම සහ නඩත්තු කිරීම සඳහා විධායක ඉංජිනේරුවරයා විසින් යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට අවසර දිය හැකි ය. එසේ වගකීම දරන තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට ඒ තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ නම සඳහන් වන නාම පුවරුවක් බිම සිට මීටර් 0.75 කට වැඩි නොවන උසකින් සිටුවීමට අවසර දෙනු ලැබිය හැකි ය.

මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක දේවල් තැබීම හෝ දැමීම වරදක් බව.

64. (අ) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක රථ වාහන ගමන් කරන කොටස, පදික මාර්ගය හෝ මාර්ග උරහිස මත කුණුරොඩු හෝ යම් ද්‍රව්‍යයක් තබන; හෝ

(ආ) මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් මත මඩුවක්, බක්කියක් හෝ ආධාරකයක් සාදන; හෝ

(ඇ) නිවාසයකින්, ගොඩනැගිල්ලකින් හෝ ගෙවත්තකින් මාර්ගයට අපවිත්‍ර ජලය හෝ වෙනත් යම් ද්‍රව අපද්‍රව්‍යයක් එවන,

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

65. නීත්‍යානුකූල බලයක් හෝ නිදහසට කරුණක් නොමැතිව වාහනයකින් ප්‍රවාහනය කරමින් තිබිය දී මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් මත පස්, ගල්, වැලි හෝ වෙනත් එවැනි ද්‍රව්‍යයක් දමන හෝ ජලය, තෙල් හෝ එවැනි යම් ද්‍රව්‍යයක් හලන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

පස්, වැලි හෝ ගල් ආදිය මාර්ගයකට, හෝ ජාතික මහා මාර්ගයකට දැමීම වරදක් බව.

66. පොලිස් නිලධරයකු හෝ සන්නද්ධ හමුදා සාමාජිකයකු විසින් හැර, කිසිදු තැනැත්තකු විසින් විධායක ඉංජිනේරුවරයාගේ පූර්ව අවසරය ලබා නොගෙන මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් හරහා ගේට්ටුවක් හෝ බාධකයක් ඉදි නොකළ යුතු ය. එසේ ගේට්ටුවක් හෝ බාධකයක් ඉදිකරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් හරහා බාධක යනාදිය ඉදිකිරීම.

67. විධායක ඉංජිනේරුවරයා විසින්, මාර්ගයකට, මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට යාබද ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු වෙත ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීම භාරදීමේ දින සිට දින විසිඅටක් තුළ දී, මාර්ගයට, මහා මාර්ගයට හෝ ජාතික මහා මාර්ගයකට හානියක් හෝ අවහිරයක් වන ලෙස හෝ ගලිය හිරවන ලෙස ඒ මාර්ගයට, මහා මාර්ගයට හෝ ජාතික මහා මාර්ගයට හෝ එහි ඇති ගලියට ඒ ඉඩමෙන් පස් හෝ කුණු රොඩු සේදී ඒම හෝ එකතුවීම වැළැක්වීම පිණිස අවශ්‍ය වන්නා වූ කාර්යයන් කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය. එවැනි දැන්වීමක් අනුව එකී නියමිත කාලසීමාව තුළ එසේ ක්‍රියාකිරීම පැහැරහරින යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු ය.

මාර්ගයකට, මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට පස් සේදී ඒම වැළැක්වීම.

68. මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක ගමන් කරන වාහනවල සහ පදිකයන්ගේ ආරක්ෂාවට බාධාකිරීමක් සිදුකරන සහ ගොඩනැගිල්ලක් ඉදිරිපස තනා ඇති හෝ තබා ඇති යම් නීති විරෝධී ආරුක්කුවක්, තෙරු වහලක්, තෙරු ජනේලයක්, පඩි පෙළක්, තාප්පයක් හෝ ගේට්ටුවක් හෝ වෙනත් එවැනි යම් දෙයක් ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස විධායක ඉංජිනේරුවරයා විසින් යම් ගොඩනැගිල්ලක් අයිතිකරුට හෝ පදිංචිකරුට දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි ය. එවැනි දැන්වීමක් අනුව, සාධාරණ කාලයක් තුළ ක්‍රියා කිරීම පැහැරහරින යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු ය.

මාර්ගයකට, මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට ගොඩනැගිලිවලින් නෙරීම ඉවත් කිරීමේ බලය.

වරදක් සිදුකිරීම පිළිබඳ දැන්වීම විධායක ඉංජිනේරුවරයා වෙත කරනු ලැබිය යුතු බව.

69. (1) 64, 65, 66, 67 සහ 68 වන වගන්තිවල විධිවිධාන යටතේ වරදක් සිදුකර ඇති අවස්ථාවක, ඒ බව විධායක ඉංජිනේරුවරයා වෙත දැනුම් දෙනු ලැබීමෙන් පසු, වරද සිදුකිරීම නැවැත්වීම හෝ නතර කිරීම පිණිස ඔහු විසින් වහාම පියවර ගත යුතු බවට ඒ වරද සිදුකරන තැනැත්තාට විධායක ඉංජිනේරුවරයා විසින් ලිඛිතව දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබුවේ කවර තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා එහි ඇතුළත් නියම අනුව ක්‍රියාකිරීම පැහැරහැරියහොත්, ඔහු මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට යටත්විය යුතු අතර වරද නොකඩවා කරගෙන යනු ලබන විටක දී, වරද අඛණ්ඩව කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහසක දඩයකට ද යටත් විය යුතු ය.

(3) 64 සිට 68 වන වගන්ති යටතේ වරද දිගටම සිදුකරනු ලබන අවස්ථාවක දී, වරද පිළිබඳ විෂයය වන ඉදිකිරීම් හෝ දෙය කඩා දමන ලෙස හෝ ඉවත් කරන ලෙස විධායක ඉංජිනේරුවරයාට බලය දෙමින් මහෙස්ත්‍රාත්වරයා විසින් විධානාත්මක ආඥාවක් නිකුත් කළ හැකි ය. විධායක ඉංජිනේරුවරයා විසින් පොලිසියේ සහාය ඇතිව ඒ ඉදිකිරීම හෝ දෙය ඉවත් කරනු ලැබිය යුතු අතර වරදකරුගෙන් එකී ඉවත්කිරීම වෙනුවෙන් දරන ලද වියදම අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් දෙසට දොරවල් විවෘතව නොතැබිය යුතු බව.

70. (1) අතිවිශේෂ අවස්ථානුගත කරුණුවල දී ප්‍රධාන ඉංජිනේරුවරයාගේ එකඟත්වය මත, විධායක ඉංජිනේරුවරයා විසින් දෙනු බලන ලිඛිත අවසරය ඇතිව මිස, කිසිම තැනැත්තකු විසින් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් වෙතට විවෘත වන ලෙස කිසියම් පරිශ්‍රයක යම් දොරක් හෝ ගේට්ටුවක් සවිකරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් දොරක් හෝ ගේට්ටුවක් සවිකරනු ලැබූ අවස්ථාවක දී, විධායක ඉංජිනේරුවරයා විසින් එහි පදිංචිකරු වෙත කරනු ලබන දැන්වීමක් මගින් ඒ දොර හෝ ගේට්ටුව ජාතික මහා මාර්ගය වෙතට විවෘත නොවන ආකාරයට වෙනස් කරන ලෙස එකී පදිංචිකරු වෙත නියම කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් පදිංචිකරු වෙනුවට පරිශ්‍රයේ අයිතිකරු වෙත භාරදෙනු ලැබිය හැකි ය. නැතහොත් පරිශ්‍රයේ අයිතිකරු සහ පදිංචිකරු යන දෙදෙනාම වෙත භාරදෙනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ අවසරය දීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ (2) වන උපවගන්තිය යටතේ කරන ලද දැන්වීමක නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් පළාත් අධ්‍යක්ෂවරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(5) අභියාචනය මත කරන ලද යම් නියෝගයකට යටත්ව, (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් අනුව ක්‍රියා කිරීමට නියම කරමින්, ඒ උපවගන්තිය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබුවේ කවර තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා විසින් ඒ දැන්වීම භාරදෙන ලද දිනයේ සිට දින දාහතරක් ඇතුළත ඒ දැන්වීමේ නියමයන්ට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, ඒ තැනැත්තා වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දහසක් නොඉක්මවන දඩයකට යටත්විය යුතු ය.

(6) (2) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත දැන්වීමක් භාර දෙනු ලැබ ඇති විට සහ ඔහු (5) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන අවස්ථාවක දී, ඒ වරද සම්බන්ධයෙන් ඔහුට එරෙහිව නීති කෘත්‍යයක් කරගෙන යනු ලබන්නේ හෝ නොලබන්නේ වුව ද, දැන්වීම මගින් නියම කරනු ලැබූ කාර්යයක් විධායක ඉංජිනේරුවරයා විසින් කරගෙන යනු ලැබිය හැකි අතර, එසේ කිරීම වෙනුවෙන් ඔහු විසින් දරන ලද සාධාරණ වියදම් පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරුගෙන් අයකරගනු ලැබිය හැකි ය.

71. (1) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක වාහන ධාවනයට හෝ එහි ගමන් කරන්නන්ට අවහිර හෝ අන්තරාදායක වන ආකාරයෙන් නැතහොත් වාහන රියදුරන්ට හෝ දෘෂ්ටියට හෝ පොදු විදුලි පහනකින් නිකුත් වන ආලෝකයට අවහිරයක් සිදුවන ආකාරයෙන් යම් ගසක්, පඳුරක් හෝ බඩවැටියක් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් ඉදිරියට නැමී ඇති අවස්ථාවක දී, විධායක ඉංජිනේරුවරයා විසින්, එකී ගස්, පඳුරු හෝ බඩවැටි පිහිටා ඇති ඉඩමේ අයිතිකරුට හෝ පදිංචිකරුට දැන්වීමක් භාරදීමෙන් පසු අවස්ථාවෝචිත පරිදි දින හතක් ඇතුළත ඒවා පෑහීම හෝ කපා දැමීම කළ යුතු බවට නියම කරනු ලැබිය හැකි ය.

මාර්ගයට, මහා මාර්ගයට හෝ ජාතික මහා මාර්ගයට නැමී ඇති ගස් කැපීම සහ බිම හෙළීම ආදී ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් පළාත් අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(3) අභියාචනයක් මත කරන ලද යම් නියමයකට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබුවේ කවර තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්, නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලසීමාව ඇතුළත දැන්වීමේ වූ නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හැරියහොත්, ඒ දැන්වීම මගින් නියම කරනු ලැබූ කාර්යයන් විධායක ඉංජිනේරුවරයා විසින් කරනු ලැබිය හැකි අතර, එසේ කිරීම වෙනුවෙන් ඔහු විසින් දරන ලද සාධාරණ වියදම් එකී තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය හැකි ය.

මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක සතුන්ට අයාලේ යෑමට ඉඩහැරීම වරදක් බව.

72. (1) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක හෝ එහි රක්ෂිතයක් මත හෝ තුළ කවර හෝ වේලාවක දී අයාලේ යන හෝ ගැවසෙන යම් සතෙක් සොයාගනු ලැබුවහොත්, ඒ සතුන් බලාගන්නා හෝ සතුන්ගේ අයිතිකරු නැතහොත් ඒ දෙදෙනාම වරදකට වරදකරු විය යුතු ය.

මේ වගන්තියේ සතුනට අදාළව "බලාගන්නා තැනැත්තා" යන්නෙන් සතෙක් සන්තකයේ දරන්නේ හෝ දරනු ලැබිය යුත්තේ කවර තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා අදහස් වේ.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරුවන යම් තැනැත්තෙක් මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී පළමුවරට වරදකරු කරනු ලැබීම සම්බන්ධයෙන් වන විට රුපියල් දහසක් නොඉක්මවන දඩයකට ද සෑම තදනන්තර වරදක් සඳහාම රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට ද යටත් විය යුතු ය.

(3) විධායක ඉංජිනේරුවරයා විසින් බලය දෙන ලද ගවයන් අල්ලන තැනැත්තා විසින් ජාතික මහා මාර්ගයක් මත අයාලේ යන හෝ ගැවසෙන සතුන් අල්ලා තහනමට ගත යුතු අතර, විධායක ඉංජිනේරුවරයා විසින් අනුමත කරන ලද, එකී ගවයන් අල්ලන තැනැත්තාට අයිති හෝ ඒ තැනැත්තා විසින් කුලියට ගන්නා ලද පරිශ්‍රයක ඒ සතුන් ගැට ගසා තැබිය යුතු ය :

එසේ වුව ද, ඒ ගවයන් අල්ලන තැනැත්තා විධායක ඉංජිනේරුවරයා සමඟ ගිවිසුමකට එළඹ තිබිය යුතු අතර ඔහු විසින් තහනමට අල්ලාගත් සෑම සතෙක් පිළිබඳවම විධායක ඉංජිනේරුවරයා විසින් නොපමාව ළඟම ඇති පොලිස් ස්ථානයට සහ ඒ ස්ථානය පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තා කළ යුතු ය.

(4) විධායක ඉංජිනේරුවරයා විසින් තහනමට ගන්නා ලද සතුන්ගේ ආරක්ෂාකාරී භාරකාරත්වය පිළිබඳ සහතික විය යුතු අතර ඒ සතුන්ට ආහාර සැපයීම පිළිබඳව ද සහතික විය යුතු ය.

(5) මහෙස්ත්‍රාත්වරයා විසින් පනවන ලද දඩය ගෙවා ඇත්නම් මිස, තහනමට අල්ලා ගන්නා ලද කිසිදු සතෙක් අයිතකරු වෙත ආපසු භාර නොදිය යුතු ය.

(6) ඒ දඩය පනවන ලද දින සිට දින හතක් ඇතුළත ඒ සතා සම්බන්ධයෙන් හිමිකම් පෑමට සහ ඒ දඩය ගෙවීමට කිසිදු තැනැත්තෙක් ඉදිරිපත් නොවුවහොත්, විධායක ඉංජිනේරුවරයා විසින් ඒ සතා ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණීම නීත්‍යානුකූල වන අතර විධායක ඉංජිනේරුවා විසින් සතා තහනමට අල්ලා ගැනීම හා ආහාර සපයාදීම සම්බන්ධයෙන් දරන ලද යම් සාධාරණ වියදම් අයකර ගැනීමෙන් පසු ඒ විකිණීමෙන් ලැබුණු මුදල ඒකාබද්ධ අරමුදලට බැරකිරීම පිණිස ඒ ස්ථානය සඳහා අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ගෙවිය යුතුය.

(7) නීත්‍යානුකූල බලයක් හෝ අවසරයක් නොමැතිව යම් තැනැත්තකු විසින් කොටු කර තැබීමේ කාර්ය සඳහා හෝ දැනටමත් කොටුකර තබා ඇති තහනමට අල්ලාගත් යම් සතෙක් මුදාහැර හෝ ඒ සතා කොටු කර තැබූ ස්ථානයට යම් අලාභහානි සිදුකර ඇත්නම්, ඔහු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට පළමුවරට කරනු ලැබූ වරද සම්බන්ධයෙන් වූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ද යටත් විය යුතු අතර වරදකරු කිරීමෙන් පසු වරද අඛණ්ඩව කරනු ලබන කාලය තුළ එක් එක් දිනයක් සඳහා රුපියල් පන්දහසක දඩයකට යටත් විය යුතු ය.

මාර්ගයකට, මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට යම් ද්‍රව්‍යයක් දැමීම හෝ විසි කිරීම වරදක් බව.

73. (1) නීත්‍යානුකූල බලයක් හෝ අවසරයක් නොමැතිව යම් තැනැත්තකු විසින් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් වෙත හෝ මත කවර ආකාරයකින් හෝ යම් දෙයක් විසි කරනු ලැබ හෝ තබනු ලැබ එහි ප්‍රතිඵලයක් වශයෙන් මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය භාවිතා කරන්නකුට තුවාල සිදුවූයේ නම් හෝ තුවාල වීමට හෝ අනතුරුදායක වීමට ඉඩ ඇත්තේ නම්, ඔහු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ විට පළමුවන වරද සම්බන්ධයෙන් රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ද වරද අඛණ්ඩව කරගෙන යාම සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමෙන් පසු වරද අඛණ්ඩව කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහසක දඩයකට ද යටත් විය යුතු ය.

(2) නීත්‍යානුකූල බලයක් හෝ අවසරයක් නොමැතිව යම් තැනැත්තකු විසින් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් භාවිතා කරන්නකුට තුවාල සිදුවන ලෙස හෝ අනතුරු සිදුවන ලෙස යම් ගින්නක් අවුලුවන හෝ යම් ගිණිකෙළි භාණ්ඩයක් දල්වනු ලැබුවහොත් ඔහු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ විට පළමුවන වරද සම්බන්ධයෙන් රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට ද අඛණ්ඩව වරද කරගෙන යාම සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමෙන් පසු එසේ වරද අඛණ්ඩව කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන් දහසක දඩයකට යටත් විය යුතු ය.

(3) නීත්‍යානුකූල බලයක් හෝ අවසරයක් නොමැතිව යම් තැනැත්තකු විසින් යම් පරිශ්‍රයක සිට මාර්ගයකට, මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට යම් අපවිත්‍ර ද්‍රව්‍යයක්, කසළ හෝ දුගඳ හමන ද්‍රව්‍යයක් දැමීමට හෝ ගලා යාමට ඉඩ සැලැසුවහොත්, ඔහු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී ඔහු රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ වරදකරු කිරීමෙන් පසු එම වරද දිගටම සිදු කරනු ලබන අවස්ථාවක දී එසේ වරද දිගටම සිදු කරන සෑම එක් එක් දිනය සඳහා ම රුපියල් පන්දහස බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය.

මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් හරහා කඹ එලීම වරදක් බව.

74. මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් භාවිත කරන්නට අනතුරු සිදුවන ආකාරයට කඹයක් හෝ යම් උපකරණයක් කිසියම් කාර්යයක් සඳහා එකී මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය හරහා එලනු ලබන හෝ තබන යම් තැනැත්තකු අනතුර පිළිබඳ ප්‍රමාණවත් දැණුම්දීමක් ඔහු විසින් එකී මාර්ග භාවිතා කරන්නට දෙන ලද බව ඔප්පු කරන්නේ නම් මිස, වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

විධායක ඉංජිනේරුවරයා විසින් පරිශ්‍රවල පදිංචිකරුවන් වෙත ඇතැම් ක්‍රියා කරන ලෙස නියම කළ හැකි බව.

75. (1) යම් වහලයකින් හෝ පරිශ්‍රයක වෙනත් යම් කොටසකින් මාර්ගයකට හෝ මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට ජලය වැටීම වැළැක්වීම සඳහා යම් මාර්ගයකට හෝ මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට යාබද පරිශ්‍රයේ පදිංචිකරු වෙත නිවේදනයක් නිකුත් කරනු ලැබූ දින සිට දින විසි අටක කාලයක් ඇතුළත වැහිපීලි හෝ දිය බස්නාවක් ඉදිකිරීමට හෝ සිටුවීමට හා ඉන්පසු ඒවා නඩත්තු කිරීම සිදු කරන ලෙස විධායක ඉංජිනේරුවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ කරන ලද නිවේදනයක් මගින් වූ නියමයකින් අතෘප්තියට පත් තැනැත්තකු විසින් ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) අභියාචනයක් මත කරන යම් නියෝගයකට යටත්ව, මේ වගන්තිය යටතේ නිවේදනයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද එකී තැනැත්තා විසින් (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත නිවේදනයේ දක්වා ඇති කොන්දේසි අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වන්නේ නම්, ඔහු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් දහසක් නොඉක්මවන දඩයකට ද එසේ වරදකරු කරනු ලැබීමෙන් පසු වරද දිගටම කරගෙන යනු ලබයි නම් ඔහු තවදුරටත් වූ වරදකට වරදකරු වන අතර එසේ වරද කරනු ලැබූ එක් එක් දිනය සඳහා රුපියල් සියයක් නොඉක්මවන දඩයකට ද යටත් විය යුතු ය.

මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් මත පලංචි ආදිය ඉදිකිරීම සඳහා අවසර ලබාගත යුතු බව.

76. (1) කිසියම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් හෝ යම් ගොඩනැගිල්ලක් කඩාදැමීම, වෙනස් කිරීම, අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හෝ පවිත්‍ර කිරීම සම්බන්ධයෙන් කිසිඳු තැනැත්තකු විසින් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් මත හෝ උඩින් මාර්ගයට, මහා මාර්ගයට හෝ ජාතික මහා මාර්ගයට අවහිර විය හැකි පරිදි යම් පලංචියක් හෝ වෙනත් යම් ඉදිකිරීමක්, එසේ ඉදිකිරීම පිණිස විධායක ඉංජිනේරුවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මගින් බලය දී ඇත්තේ නම් මිස සහ බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි අනුව ක්‍රියා කරන්නේ නම් මිස, ඉදිකිරීම හෝ රඳවා තැබීම නොකළ යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් යම් ඉදිකිරීමක් සම්බන්ධයෙන් වූ බලපත්‍රයක් සඳහා විධායක ඉංජිනේරුවරයාගෙන් ඉල්ලා සිටිනු ලබන්නේ නම් සහ විධායක ඉංජිනේරුවරයා විසින් සාධාරණ ලෙස ඉල්ලා සිටින ඉදිකිරීමට අදාළ විස්තර විධායක ඉංජිනේරුවරයා වෙත සපයන්නේ නම්—

(අ) ඒ ඉදිකිරීමෙන් මාර්ගයට, මහා මාර්ගයට හෝ ජාතික මහා මාර්ගයට අවහිරයක් සිදු නොවන බව ; සහ

(ආ) ඉල්ලුම්කරු විසින් යොජනා කර ඇති ඉදිකිරීමේ ආකාරයට නොව, අන්‍යාකාර ලෙස ඉදිකරනු ලැබූ ඉදිකිරීමකින් මාර්ගයට, මහා මාර්ගයට හෝ ජාතික මහා මාර්ගයට වඩා අඩු අවහිරවීමක් සිදුවන බව,

විධායක ඉංජිනේරුවරයා සලකන්නේ, නම් මිස, බලපත්‍රයක් නිකුත් කිරීම විධායක ඉංජිනේරුවරයාගේ කාර්යය විය යුතු ය.

(3) විධායක ඉංජිනේරුවරයා විසින් (2) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් මත බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, හෝ ඉල්ලුම්කරු විරුද්ධත්වයක් දක්වන නියම අන්තර්ගත වූ බලපත්‍රයක් නිකුත් කරන්නේ නම්, ඒ ප්‍රතික්ෂේප කිරීමට හෝ බලපත්‍රයේ නියමවලට එරෙහිව ඉල්ලුම්කරු විසින් පළාත් අධ්‍යක්ෂවරයා වෙත අභියාචනය කළ හැකි අතර එවැනි අභියාචනයක් මත, පළාත් අධ්‍යක්ෂවරයා විසින්—

(අ) එකී අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව වූ අභියාචනයක් වන විට එකී ඉල්ලීම සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කරන ලෙස විධායක ඉංජිනේරුවරයාට විධාන කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) එකී අභියාචනය බලපත්‍රයේ නියමවලට එරෙහිව වූ අභියාචනයක් වන විට ඒ නියම වෙනස් කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(4) ඉදිකිරීමක් සම්බන්ධයෙන් විධායක ඉංජිනේරුවරයා විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම්, තැනැත්තකු වෙත ද—

(අ) අඳුර පවතින කාලය තුළ දී ඒ ඉදිකිරීමට ප්‍රමාණවත් ලෙස ආලෝකය සැපයීම ; සහ

(ආ) කිසියම් වාහන ගමනාගමන පාලන උපකරණ ඉදිකිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විධායක ඉංජිනේරුවරයා විසින් ඔහු වෙත ලිඛිතව දෙන ලද කිසියම් විධාන අනුව ක්‍රියා කිරීම,

ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන තැනැත්තකු හෝ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක නියම අනුව ක්‍රියා කිරීම හෝ (4) වන උපවගන්තිය යටතේ ඔහු වෙත පනවන ලද කාර්යයන් ඉටුකිරීම නිදහසට සාධාරණ කරුණක් නොමැතිව පැහැරහරින තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට යටත්විය යුතු ය.

77. (1) විධායක ඉංජිනේරුවරයාගේ එකඟත්වය ඇතිව යම් තැනැත්තකු විසින් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් මත, ගොඩනැගිලි ද්‍රව්‍ය හෝ වෙනත් දේවල් තාවකාලිකව ගොඩගැසීම හෝ තාවකාලික කැනීම් සිදු කිරීම කරනු ලැබිය හැකි ය.

විධායක ඉංජිනේරුවරයාගේ එකඟත්වය ඇතිව මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් මත ගොඩනැගිලි ද්‍රව්‍ය යනාදිය ගොඩගැසීම කළ හැකි බව.

(2) විධායක ඉංජිනේරුවරයා විසින් සුදුසුයයි කල්පනා කරන, විශේෂයෙන් ම උපයෝගීතා සේවාවලට අලාභහානි වැළැක්වීම හෝ ඒවායේ ප්‍රවේශය සහතික කිරීම සඳහා වූ කොන්දේසිවලට යටත් ව විධායක ඉංජිනේරුවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ඔහුගේ එකඟත්වය දෙනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ එකඟතාවය ප්‍රතික්ෂේප කිරීමෙන් අතෘප්තියට පත් තැනැත්තකු විසින් හෝ කොන්දේසිවලට යටත්ව එවැනි එකඟත්වයක් දෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද එකී තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි ඒ ප්‍රතික්ෂේප කිරීමට හෝ පනවන ලද කොන්දේසිවලට එරෙහිව පළාත් අධ්‍යක්ෂවරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(4) ඒ ගොඩගැසීම හෝ කැනීම සම්බන්ධයෙන් වූ වාහන ගමනාගමන සංඥා ඉදිකිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විධායක ඉංජිනේරුවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ එවැනි ගොඩගැසීමක් හෝ කැනීමක් කරන තැනැත්තකු වෙත ලියවිල්ලකින් දෙන ලද විධාන අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(5) යම් තැනැත්තකු විසින් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් මත යම් ගොඩනැගිලි ද්‍රව්‍යයක් හෝ වෙනත් දෙයක් තැබීමේදී හෝ ඒ තුළ කැනීමක් කරන අවස්ථාවක දී ඔහු විසින් විධායක ඉංජිනේරුවරයා විසින් ඉඩදෙනු ලබන කාලයට වඩා දීර්ඝ කාලයක් ඒ මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහාමාර්ගය තුළ ඒ අවහිරය හෝ කැනීම දිගටම පැවතීමට නොසැලැස්විය යුතු අතර, තව ද ඔහු විසින්—

(අ) ඒ බාධකය හෝ කැනීම නිසි ආකාරයෙන් ආවරණය කර තැබිය යුතු අතර අඳුර පවතින කාලය තුළ යථා පරිදි ආලෝකමත් කර තැබීමට කටයුතු සැලැස්විය යුතු ය ; සහ

(ආ) විධායක ඉංජිනේරුවරයා විසින් නියම කරනු ලැබුවහොත් ඒ බාධකය ඉවත් කිරීම හෝ කැනීම් වසා දැමීම කළ යුතු ය.

(6) (අ) (1) වන උපවගන්තිය යටතේ එකඟත්වය දෙනු ලබන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද, සාධාරණ හේතුවක් හෝ අවසරයක් නොමැතිව ඒ කොන්දේසිවලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින ; හෝ

(ආ) සාධාරණ හේතුවක් හෝ අවසරයක් නොමැතිව (4) වන උපවගන්තිය යටතේ ඔහු වෙත පනවන ලද කාර්යය ඉටුකිරීම පැහැර හරින ; හෝ

(ඇ) (5) වන උපවගන්තිය යටතේ ඔහු වෙත පනවන ලද කාර්යයක් ඉටු කිරීම පැහැර හරින,

කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඒ කඩකිරීම හෝ පැහැරහැරීම කරන ලද එක් එක් දිනය සඳහා රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ඒ තැනැත්තා යටත්විය යුතු ය.

78. (1) මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක වැඩ ක්‍රියාත්මක කරවීම සඳහා වගකිවයුතු යම් තැනැත්තකු හෝ කොන්ත්‍රාත්කරුවකු විසින්—

මාර්ගයක වැඩ කටයුතු සිදු කරනු ලබන විට ගත යුතු පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග.

(අ) ඒ වැඩ අවසන් වනතුරු ගමනාගමනයට සිදුවන අනතුරු වැළැක්වීම සඳහා, ගමනාගමනය විධිමත් කිරීම සඳහා සහ අනතුරු පිළිබඳව රථවාහනවලට පූර්වාවාද කිරීම සඳහා විධායක ඉංජිනේරුවරයා විසින් නියම කරනු ලබන පරිදි වූ මාර්ග බාධක සහ මාර්ග සංඥා ඉදිකරනු ලැබිය යුතු අතර, වැඩ අවසන් වූ වහාම ඒවා ඉවත් කළ යුතු ය;

(ආ) ඒ වැඩ කරන ස්ථානය යථා පරිදි ආරක්ෂා සහිතව ආවරණය කර තිබීමට ද අඳුර පවතින කාලය තුළ දී ඒ ස්ථානයට ආලෝකය සපයා තැබීමට ද කටයුතු සැලැස්විය යුතු ය.

(2) යම් තැනැත්තකු හෝ කොන්ත්‍රාත්කරුවකු විසින් (1) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම පැහැරහැර ඇත්නම්, ඔහු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට එකී පැහැරහැරීම අඛණ්ඩව සිදු කරනු ලැබූ එක් එක් දිනය සඳහා දිනකට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(3) නීත්‍යානුකූල බලයක් හෝ නිදහසට කරුණක් නොමැතිව, යම් තැනැත්තකු විසින්—

(අ) මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් භාවිතා කරන්නට එහි වූ යම් බාධකයක් පිළිබඳව පූර්වාවාදයක් දීමේ කාර්යය සඳහා හෝ මාර්ගයක්, හෝ

මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් භාවිත කරන්නන් හට එසේ යම් අවහිරයකින් ඇති විය හැකි අනතුරුවලින් ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා (1) වන උපවගන්තියට අනුව ඉදිකරන ලද හෝ තබන ලද යම් බාධකයක්, මාර්ග සංඥාවක් හෝ පහනක් කඩා දමන්නේ නම්, ඉවත් කරන්නේ නම් හෝ ඒවායේ යම් වෙනසක් කරන්නේ නම් ; සහ

(ආ) එසේ තබා ඇති පහනක් නිවා දමන්නේ නම්,

ඒ තැනැත්තා වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් හාරදහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

## VIII වන කොටස

### අධිවේගී මහා මාර්ග සහ සීමිත ප්‍රවේශ මහා මාර්ග භාවිතා කිරීම

තහනම් කරන ලද භාවිතයන්.

79. (1) යම් තැනැත්තකු අධිවේගී මහා මාර්ගයක් හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක් මත පයින් ගමන් නොකළ යුතු ය.

(2) යම් තැනැත්තකු අධිවේගී මහා මාර්ගයක් හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක් මත—

(අ) මෝටර් රථයක හෝ මෝටර් රථයකට ඈඳන ලද ට්‍රේලරයක් තුළ ගෙන යන සතෙකු හැර වෙනත් යම් සතෙක් මත යැම සතෙකු ගෙන යාම ; හෝ

(ආ) ත්‍රී රෝද රථයක්, අත් ට්‍රැක්ටරයක් පැදවීම හෝ බයිසිකලයක් පැදවීම හෝ ගෙන යාම ; හෝ

(ඇ) (i) මෝටර් වාහනයකට නොවන ; හෝ

(ii) මෝටර් වාහනයකට ඈඳන ලද ට්‍රේලරයක්,

නොවන වාහනයක් පැදවීම ;

(ඈ) තැනිතලා මාර්ගයක ගමන් කිරීමේ දී අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වේගය හෝ නියම කරනු ලැබූ වේගය පවත්වාගෙන යෑමට අපොහොසත් වන වාහනයක් හෝ වාහන සමූහයක් පැදවීම ; හෝ

(ඉ) යම් නියමිත වර්ගයක වාහනයක් පැදවීම,

නොකළ යුතු ය.

(3) "U" සංකේතය දක්වමින් හැරවීමකට අවසර දෙන ලද ස්ථානයක දී හැර අධිවේගී මහා මාර්ගයක හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක වාහනයක් ධාවනය කරන රියදුරකු විසින් "U" ආකාරයේ හැරවීමක් නොකළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ කාර්යය සඳහා සමාන හෝ සමාන්තර රථවාහන මාර්ගයක් දිගේ විරුද්ධ දිශාවට ගමන් කිරීමට වාහනයක් හැරවීමේ දී "U" ආකාරයේ හැරවීමක් බවට පත් වේ.

(5) යම් අධිවේගී මහා මාර්ගයක හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක නඩත්තු කටයුතු හෝ ඉදිකිරීම් කටයුතුවල යෙදී සිටින යම් තැනැත්තකු හට මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(6) මේ වගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී පළමුවරට වරදකරු කිරීම සම්බන්ධයෙන් රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ද දෙවන වරට නැතහොත් තදනන්තර වරදක් සම්බන්ධයෙන් වූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට ද යටත් විය යුතු ය.

## IX වන කොටස

### මාර්ග භාවිතා කරන ප්‍රජාව විසින් මාර්ග මෙහෙයුම් වැඩ සහ නඩත්තු කිරීම

80. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයන් මගින් යම් ප්‍රදේශයක ජීවත්වන ජනතාවගේ හෝ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ පදිංචිව සිටින සියලු තැනැත්තන්ගේ සහභාගීත්වයෙන් මාර්ග මෙහෙයුම් කටයුතු හෝ නඩත්තු කටයුතු

ප්‍රජා මූල සංවිධාන විසින් මාර්ග නඩත්තු කළ හැකි බව.

කිරීම සඳහා අවශ්‍ය වන බැව් පෙනී යන්නේ නම් ජාතික මහා මාර්ගයක් නොවන මාර්ගයක හෝ මහා මාර්ගයක මෙහෙයුම් කටයුතු හෝ නඩත්තු කිරීමට එම පුද්ගලයන් විසින් පිහිටුවනු ලබන ප්‍රජා මූල සංවිධානයක් වෙත භාරදෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය සඳහන් නියමයක් මගින් මාර්ගයේ දිග සහ පළල සහ රක්ෂිත ඇත්නම් ඒවා නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට පෙර විධායක ඉංජිනේරුවරයා විසින් අදාළ ප්‍රජා මූල සංවිධානය සමග ගිවිසුමක් අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් ගිවිසුමේ නියම සහ කොන්දේසිවලට වෙනත් කරුණු අතර පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය :—

(අ) අධිකාරිය හෝ අදාළ ප්‍රාදේශීය ලේකම් හෝ අදාළ පළාත් පාලන ආයතනය විසින් අදාළ ප්‍රජා මූල සංවිධානය වෙත ලබා දෙන කාර්මික හෝ මූල්‍ය සහාය ;

(ආ) ප්‍රජා මූල සංවිධානය විසින් පරිත්‍යාග සහ දායක මුදල් භාර ගැනීමට අදාළ උපදෙස් ;

(ඇ) ප්‍රජා මූල සංවිධානයේ පරිපාලනය සහ ගිණුම් විගණනය ;

(ඈ) එකී මාර්ගයේ වැඩ මෙහෙයුම් කටයුතු සහ නඩත්තු කිරීම පිළිබඳව ප්‍රජා මූල සංවිධානයේ, මාර්ගය භාවිත කරන ප්‍රජාවගේ, අධිකාරියේ, අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ සහ අදාළ පළාත් පාලන ආයතනයේ කාර්ය සහ වගකීම්.

## X වන කොටස

### විවිධ

දැන්වීම්වල භාෂාව.

81. (1) මේ පනත යටතේ භාර දිය යුතු සෑම දැන්වීමක්ම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් විය යුතු ය.

(2) යම් තැනැත්තකු වෙත යැවිය යුතු සෑම දැන්වීමක්ම ලියාපදිංචි තැපෑලෙන් හෝ ඒ තැනැත්තා වෙත පුද්ගලිකව භාරදීම හෝ ඒ තැනැත්තාගේ නිවසේ සිටින සාමාජිකයකුට භාරදීම හෝ ඔහුගේ නිවසේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවීම හෝ කරනු ලැබිය හැකි අතර, ඉහත සඳහන් කවර හෝ ආකාරයකට භාර දෙන ලද දැන්වීමක් ඒ තැනැත්තා වෙත පුද්ගලිකව සහ යථා පරිදි භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

82. (1) අධිවේගී මහා මාර්ගයකට හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයකට ඇතුළු වන වාහනයක රියදුරු විසින්— අධිවේගී මහා මාර්ගයකට හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයකට ඇතුළුවීම සහ පිටවීම.

(අ) ක්‍රමයෙන් වේගය වැඩි කිරීමේ ධාවන තීරුවක් නොමැති නම් අධිවේගී මහා මාර්ගයේ හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයේ ගමන් කරන වාහන සඳහා මාර්ගය ඉඩදිය යුතු අතර ;

(ආ) ක්‍රමයෙන් වේගය වැඩි කිරීමේ ධාවන තීරුවක් ඇත්නම් එය භාවිතා කරමින් අධිවේගී මහා මාර්ගයේ හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයේ රථවාහනවලට එකතු වන විට, අනෙකුත් ධාවන පථ භාවිත කරන්නන්ට අන්තරාදායක නොවන ආකාරයට නිසි උද්යෝගයෙන් කටයුතු කළ යුතු ය.

(2) අධිවේගී මහා මාර්ගයකින් හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයකින් පිටවී යන වාහනයක රියදුරු විසින්—

(අ) අධිවේගී මහා මාර්ගයේ හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයේ පිටවීම සඳහා උචිත වාහන ධාවන තීරය තුළට නිසි වේලාවේ දී ඇතුල්විය යුතු ය ; සහ

(ආ) අඩු වේග තීරුවක් තිබේ නම් ප්‍රායෝගිකව හැකි ඉක්මණින් එයට ඇතුල්වීම,

කළ යුතු ය.

(3) වාහනයක රියදුරකු විසින්, ප්‍රවේශවීමට බලය දෙන ලද නියමිත ස්ථානයකින් හැර වෙනත් ස්ථානයකින් අධිවේගී මහා මාර්ගයට හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයට ඇතුල්වීම නොකළ යුතු ය.

(4) මේ වගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී පළමුවරට වරදකරු කරනු ලැබීම සම්බන්ධයෙන් වූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ද දෙවන හෝ තදනන්තර වරදකට වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට ද ඒ තැනැත්තා යටත් විය යුතු ය.

වාහන නැවැත්වීම.

83. (1) වාහනයක රියදුරකු විසින්—

(අ) එකී ස්ථානය භාවිතා කිරීමට අදාළ වන සීමාකිරීම්වලට යටත්ව වාහන නවතා තැබීම සඳහා වෙන්කර ඇති වාහන නැවැත්වීමේ ස්ථානයක දී ;

(ආ) යම් තැනැත්තකුට තුවාල සිදුවීමක් හෝ දේපළකට අලාභහානියක් සිදුවීම වැළැක්වීමට අවශ්‍ය වන අවස්ථාවක දී ;

(ඇ) යම් තැනැත්තකු විසින් නීතිය අනුව පිළිපැදිය යුතු යම් මාර්ග සංඥාවකට හෝ වෙනත් උපදේශයකට අනුකූලතාව දැක්වීමක් වන අවස්ථාවක දී ;

(ඈ) අධිකාරිය විසින්, අධිවේගී මහා මාර්ගයක් හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක් නඩත්තු කිරීමේ හෝ ඉදිකිරීමේ කටයුතු කරගෙන යාමේ දී ඒ කාරණයන් කරගෙන යෑම සඳහා ඉඩ සලසාදීම සඳහා ;

(ඉ) වාහනය නැවැත්වීම නොවැළැක්විය හැකි ප්‍රමාණයට ඒ වාහනය අබලන් වී ඇති අවස්ථාවක දී ;

(ඊ) අබලන් වූ වාහනයකට සහායක් ලබා ගැනීමට කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් වාහනයක් නැවැත් වූ අවස්ථාවක දී ;

(උ) යම් තැනැත්තකු විසින් රථවාහන අනතුරක් හෝ එවැනි දැනුම් දිය යුතු අවස්ථාවක් හෝ සිද්ධියක් පිළිබඳ කෙලින් ම හෝ හදිසි දුරකථනයක් නැතහොත් සමාන උපකරණයක් භාවිතා කරමින් පොලීසියට, අධිකාරියට හෝ වෙනත් රථවාහන අධිකාරියකට දැනුම් දෙන අවස්ථාවක දී ; හෝ

(ඌ) අධිකාරියේ ගිවිසුමකට අනුව ගමනාගමනයට සිදුවන බාධකයක් ඉවත් කිරීම සඳහා වාහනයක් භාවිතා කරන අවස්ථාවක දී හැර,

අධිවේගී මහා මාර්ගයක් හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක් මත වාහනයක් නවතා තැබීම නොකළ යුතු ය.

(2) අධිවේගී මහා මාර්ගයක් හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක් මත වාහනයක් නවතා තැබූ රියදුරකු විසින් ඒ වාහනය රථවාහන ගමන් කරන කොටසින් ඉවත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියෙන් නියම කරනු ලැබූ පරිදි අධිවේගී මහා මාර්ගයේ හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයේ නවතා තැබූ වාහනයක් රථවාහන ගමන් ගන්නා කොටසින් හෝ මාර්ගයෙන් අයිනට ඉවත් කිරීමට නොහැකි තැනැත්තකු විසින් එහි වාහනයක් තිබෙන බව ඒ වෙත ළඟාවන වාහන රියදුරන්ට ප්‍රමාණවත් පූර්වාවාදයක් සැලසීම පිණිස ප්‍රමාණවත් දුරක සිට පූර්වාදාත්මක ත්‍රිකෝණාකාර උපකරණයක් මගින් සංඥා කළ යුතු ය.

(4) මේ වගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැරහරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී පළමුවරට කරනු ලැබූ වරද සම්බන්ධයෙන් වන විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ද දෙවන හෝ තදනන්තර වරදකට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

බාල්ක ආදිය තැබීම සීමා කිරීම.

84. (1) විධායක ඉංජිනේරුවරයාගේ අවසරය නොමැතිව, කිසිදු තැනැත්තකු විසින් මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් උඩින් දිගේ හෝ හරහා යම් මාර්ග සංඥාවක් උඩින් යෙදූ බාල්ක, පයිප්ප, කේබල් කම්බි වයර් මඟ දෙපස විහිදෙන අට්ටාල, දැන්වීම් පුවරු, හෝ යකඩ පීලි නැතහොත් සමාන උපකරණයක් තැබීම හෝ සවිකිරීම නොකළ යුතු අතර, විධායක ඉංජිනේරුවරයා තම අවසරය දීමේ දී යෝග්‍ය යයි සිතන යම් සාධාරණ නියමයන් සහ කොන්දේසි පනවනු ලැබිය හැකි ය.

(2) (3) වන උපවගන්තියට යටත්ව (1) වන උපවගන්තිය යටතේ වූ අවසරයක් ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ එකී අවසරයට පනවන ලද නියම සහ කොන්දේසිවලින් අතෘප්තියට පත් තැනැත්තකු විසින් පළාත් අධ්‍යක්ෂවරයා වෙත අභියාචනාවක් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ විධායක ඉංජිනේරුවරයා විසින් දෙන ලද අවසරයට ඔහු විසින් පනවනු ලැබූ යම් නියමයකට හෝ කොන්දේසියකට අදාළ මාර්ගය, මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය භාවිතා කරන තැනැත්තන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ කාර්ය සඳහා හෝ එහි වාහන ගමනාගමනයට බාධාවීම වැළැක්වීම සඳහා අවශ්‍ය නියම හෝ කොන්දේසි යයි විධායක ඉංජිනේරුවරයා විසින් ප්‍රකාශ කරන්නේ නම්, එකී නියම සහ කොන්දේසිවලට විරුද්ධව (2) වන උපවගන්තිය යටතේ අභියාචනයක් නොතිබිය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන හෝ ඒ යටතේ දෙනු ලැබූ යම් අවසරයකට අදාළ නියමයන් හෝ කොන්දේසි කඩකර ඇත්නම්, ඒ තැනැත්තා වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට වරද අඛණ්ඩව කරගෙන යනු ලැබූ එක් එක් දිනයක් සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට යටත්විය යුතු ය.

ඉදිකිරීම ආදිය පාලනය කිරීම.

85. (1) කිසිදු තැනැත්තකු විසින් විධායක ඉංජිනේරුවරයාගේ අනුමතයක් නොමැතිව මාර්ගයක්, මහා මාර්ගයක් හෝ ජාතික මහා මාර්ගයක් යටින් බිංගෙයක්, උමගක්, වළක් හෝ වෙනත් එවැනි යම් දෙයක් ඉදි නොකළ යුතු අතර, මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් බිංගෙයක්, උමගක්, වළක් හෝ වෙනත් එවැනි යම් දෙයක් ඉදිකරනු ලැබ ඇති තැනැත්තා වෙත විධායක ඉංජිනේරුවරයා විසින් දැන්වීමක් මගින් එකී දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට එය ඉවත් කිරීමට හෝ වෙනස් කිරීමට හෝ පුළු වශයෙන් වෙනස් කිරීමට ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(2) කිසිදු තැනැත්තකු විසින් විධායක ඉංජිනේරුවරයාගේ අනුමතයක් නොමැතිව මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක මධ්‍යයේ සිට මීටර් පනහකින් වූ දුරක් ඇතුළත මීටර් තුනකට වැඩි ගැඹුරකින් යම් කැනීමක් නොකළ යුතු ය.

(3) විධායක ඉංජිනේරුවරයාගේ අනුමැතියක් නොමැතිව යම් පාලමක, සපත්තු පාලමක හෝ ඉදිකිරීමක අන්තිම කෙළවරේ සිට මීටර් එකසිය පනහක් ඇතුළත හෝ ඒ ආසන්නයෙහි හෝ මාර්ගයේ, මහා මාර්ගයේ හෝ ජාතික මහා මාර්ගයේ අන්තිම කෙළවරේ සිට මීටර් සීයක දුරක් ඇතුළත හෝ ඒ ආසන්නයෙහි වැලි ගොඩ දැමීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ අනුමතයක් දීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ ඒ යටතේ වූ දැන්වීමක අඩංගු නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් පළාත් අධ්‍යක්ෂවරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(5) (1) වන, (2) වන හෝ (3) වන උපවගන්තිවල විධිවිධාන කඩකරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(6) අභියාචනයක් මත කරන ලද ආඥාවකට යටත්ව, යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ ඔහු වෙත භාරදෙන ලද දැන්වීමක නියමයකට අනුව හෝ (2) වන හෝ (3) වන උපවගන්තිවල විධිවිධානවලට අනුව ක්‍රියාකිරීම පැහැර හරිනු ලැබුවහොත්, ඔහු වැඩිදුරටත් වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට එකී පැහැර හැරීම කරනු ලැබූ එක් එක් දිනයක් සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(7) (1) වන, (2) වන හෝ (3) වන උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරමින් ඉදිකරන ලද බිංගෙයක්, උමගක්, වළක් හෝ වෙනත් එවැනි යම් දෙයක් විධායක ඉංජිනේරුවරයා විසින් වසා දැමීම හා එසේ කිරීම සඳහා ඔහු විසින් දරන ලද සාධාරණ වියදම් වරදකරුගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල විය යුතු ය

86. (1) අමාත්‍යවරයා විසින් හේතු සඳහන් කර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මහජනතාවට යම් මහා මාර්ගයකට හෝ මහා මාර්ගයකින් හෝ ජාතික මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකින් නැතහොත් යම් මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක කොටසකට හෝ කොටසකින් ඇතුල්වීම, ඒවායෙන් පිටතට පැමිණීම තහනම් කිරීම හෝ සීමා කිරීම කරනු ලැබිය හැකි ය. මාර්ගයකට, මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට ප්‍රවේශවීම සීමා කිරීමේ බලය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමෙන් පසු අදාළ දිස්ත්‍රික්කයේ ප්‍රධාන ඉංජිනේරුවරයාගේ එකඟත්වය ඇතිව විධායක ඉංජිනේරුවරයා විසින් ලිඛිතව අනුමැතිය දීමකින් තොරව කිසිම තැනැත්තකු විසින් යම් ප්‍රවේශ මාර්ගයක්, යම් මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට සම්බන්ධ නොකළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසි පන්දහසකට වැඩි නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය. එම තැනැත්තා විසින් කරන ලද සම්බන්ධ කිරීම ඉවත් කිරීමෙන් එම මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය එහි මුල් තත්ත්වයට පත් කිරීමේ දී විධායක ඉංජිනේරුවරයා විසින් දරන ලද වියදම එකී තැනැත්තා විසින් විධායක ඉංජිනේරුවරයාට ගෙවීමට ඔහු යටත් විය යුතු ය.

(4) අවස්ථානුගත කරුණු අනුව විධායක ඉංජිනේරුවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී (3) වන උපවගන්තිය යටතේ නඩු පැවරීම වෙනුවට ඔහු විසින්—

(අ) වරදකරු විසින් කරන ලද සම්බන්ධ කිරීම වහාම ඉවත් කර එම ප්‍රසිද්ධ පාර හෝ ජාතික මහා මාර්ගය එහි මුල් තත්ත්වයට පත් කරන ලෙස වරදකරුට නියම කරනු ලැබිය හැකි ය ; හෝ

(ආ) වරදකරු විසින් කරන ලද සම්බන්ධ කිරීම ඉවත්කිරීමට ඔහු අපොහොසත් වුවහොත් එම සම්බන්ධ කිරීම ඉවත් කර මහා මාර්ගය හෝ ජාතික මහා මාර්ගය එහි මුල් තත්ත්වයට පත්කොට ඔහුට දැරීමට සිදු වූ වියදම වරදකරුගෙන් අයකර ගැනීමට පියවර ගත යුතු ය.

විධායක ඉංජිනේරුවරයාගේ අවසරය අත්‍යාවශ්‍ය බව.

87. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් මාර්ගයක, මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට යාබදව යම් කටයුත්තක් කරගෙන යෑම සඳහා බලපත්‍ර ප්‍රදානය කරන ඕනෑම පුද්ගලයකු, අධිකාරියක් හෝ ආයතනයක් විසින් එම බලපත්‍රය නිකුත් කිරීමට පෙර ප්‍රදේශයේ විධායක ඉංජිනේරුවරයාගේ අවසරය ලබාගැනීම එම පුද්ගලයාගේ, අධිකාරියේ හෝ ආයතනයේ කාර්යය විය යුතු ය.

පොලිස් නිලධරයන්ගේ සහ ග්‍රාම නිලධරයන්ගේ කාර්ය භාරය.

88. තම බලප්‍රදේශය ඇතුළත මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් සිදු කරනු ලබන යම් වරදක් වැළැක්වීමේ දී, ඊට ආධාර කිරීම සහ සහාය දීම සියලු පොලිස් නිලධරයන්ගේ සහ ග්‍රාම නිලධාරීන්ගේ කාර්යය විය යුතු ය.

89. (1) මේ පනත යටතේ නියම කර ඇති යම් කාරණයක් ඉටුකිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා හෝ නියෝග සෑදීමට නියම කර ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තිය මගින් අමාත්‍යවරයා වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත දැක්වෙන කාරණාවලින් සියලුම හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය, එනම්—

(අ) අධිවේගී මහා මාර්ගයක් හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක ධාවනය කරනු ලබන මෝටර් රථයක පවත්වාගත යුතු වේගය ;

(ආ) මාර්ගයක, මහා මාර්ගයක, ජාතික මහා මාර්ගයක හෝ අධිවේගී මහා මාර්ගයක හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක භාවිතා කළ හැකි වාහන වර්ග ;

(ඇ) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගවලට අදාළව අයකරගත යුතු සහ ගෙවිය යුතු ගාස්තු ;

(ඈ) පනතේ විධිවිධාන කඩකිරීම සම්බන්ධයෙන් දැනුම්දීමේ දී භාවිත කරනු ලැබිය හැකි ආකෘති පත්‍ර ;

(ඉ) ජාතික මහා මාර්ගයක හෝ අධිවේගී මහා මාර්ගයක හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක නියමිත වාහන භාවිත නොකළ යුතු වේලාවන් ඇතුළු ජාතික මහා මාර්ගයක් හෝ අධිවේගී මහා මාර්ගයක් හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක් භාවිත කිරීම පිළබඳ සීමා ;

(ඊ) මාර්ග, මහා මාර්ග හෝ ජාතික මහා මාර්ග හෝ අධිවේගී මහා මාර්ග හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ග වල දෙපස තීරුවේ අනවශ්‍ය සංවර්ධන වළක්වාලීම ;

(උ) පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් එළඹෙන ගිවිසුම් යටතේ අධිකාරියේ කාර්ය සහ වගකීම්.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින සිට හෝ ඒ සඳහා නියම කරනු ලැබිය හැකි පසු දිනයක සිට එය බලාත්මක විය යුතු ය.

(4) සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

මංමාවත් ආඥාපනත ඉවත් කිරීම සහ අන්තර්කාලීන විධිවිධාන.

90. (1) (193 වන අධිකාරය වූ) මංමාවත් ආඥාපනත නියමිත දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරනු ලැබේ.

(2) (193 වන අධිකාරය වූ) මංමාවත් ආඥාපනත ඉවත් කිරීම නොතකා—

(අ) (මෙහි මින් මතු "ඉවත් කළ ආඥාපනත" යනුවෙන් සඳහන් කරනු ලබන) මංමාවත් ආඥාපනත යටතේ ඇතුළත් වූ සහ නියමිත දිනට ඉහතින් ම වූ දිනයේ දී බලාත්මකව පැවති සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් නියමිත දිනයේ සිට අධිකාරය විසින් ඇතුළත් වූ කොන්ත්‍රාත් සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා බලාත්මක කරනු ලැබිය හැකි ය ;

(ආ) ඉවත් කරන ලද ආඥාපනත යටතේ සහ නියමිත දිනට ඉහතින් ම වූ දිනයේ දී නිම නොවී පවත්නා සියලු නඩු, කාරණා නඩු කටයුතු හෝ දේවල් නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව පවරන ලද නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා පවත්වාගෙන යනු ලැබිය හැකි ය ;

(ඇ) ඉවත් කරන ලද ආඥා පනත යටතේ යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකරණයක් විසින් ඇතුළත් කරන ලද සියලු තීන්දු ප්‍රකාශ හෝ ආඥා නියමිත දින සිට බලපැවැත්වෙන පරිදි අධිකාරිය වෙත හෝ අධිකාරියට විරුද්ධව ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශ හෝ ආඥා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා බලාත්මක කරනු ලැබිය හැකි ය;

(ආ) ඉවත් කරන ලද ආඥාපනත යටතේ නිකුත් කරනු ලැබූ සහ නියමිත දිනට ඉහතින් ම වූ දිනයේ දී බලාත්මකව පැවතියා වූ සියලු ප්‍රකාශ, නිවේදන, බලපත්‍ර සහ නියමයන් නියමිත දින සිට බලපැවැත්වෙන පරිදි මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව තේරුම් ගනු ලැබිය හැකි ය.

91. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

92. මේ පනතෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස— අර්ථ නිරූපණය.

"රථවාහන ගමන් කරන කොටස" යන්නෙන්, පාරක රථවාහන ගමනාගමනය සඳහා මාර්ගයක, මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක සැලසුම් කර ඇති ගමන් මාර්ගය අදහස් වන අතර, ඊට මාර්ග උරහිස හෝ අඩින ඇතුළත් නොවේ ;

"තනි තීරුවේ රථවාහන මාර්ගයක් සහිත ජාතික මහා මාර්ගයක් සඳහා ඒ ජාතික මහා මාර්ගයේ මධ්‍යය" යන්නෙන්, මිනුම් පිඹුරකින් තීරණය කළ පරිදි හෝ විධායක ඉංජිනේරුවරයා විසින් තීරණය කළ රථවාහන ගමන් කරන කොටසේ මධ්‍යස්ථ ස්ථානය අදහස් වේ ;

"තීරු දෙකේ රථවාහන මාර්ගයක් සහිත ජාතික මහා මාර්ගයක් සඳහා ඒ ජාතික මහා මාර්ගයේ මධ්‍යය" යන්නෙන්, ජාතික මහා මාර්ගයේ මධ්‍යයේ පිහිටි මධ්‍ය ස්ථානය අදහස් වේ;

"ප්‍රධාන ඉංජිනේරුවරයා" යන්නෙන්, 1988 අංක 5 දරන මාර්ග සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත යටතේ සැලසුම් කළ මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ඉංජිනේරුවරයා අදහස් වේ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනතේ 12 වන වගන්තිය යටතේ පත් කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;

"විධායක ඉංජිනේරුවරයා" යන්නෙන්, 1988 අංක 5 දරන මාර්ග සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත යටතේ යම් පළාතක් සඳහා පත්කළ මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරුවරයා අදහස් වේ ;

"අන්තර් හුවමාරු" යන්නෙන්, මෝටර් රථයක් අධිවේගී හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයකට ප්‍රවේශවීමට හෝ අධිවේගී හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයකින් පිටතට ප්‍රවේශවීමට, අධිවේගී හෝ සීමිත ප්‍රවේශ මහා මාර්ගයක් දිගේ පිහිටුවා ඇති ස්ථානයක් අදහස් වේ ;

"නියමිත" යන්නෙන්, විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග මගින් නියම කිරීම අදහස් වේ ;

"පළාත් අධ්‍යක්ෂ" යන්නෙන්, මාර්ග සංවර්ධන අධිකාරියෙන් පළාතක් සඳහා පත් කළ පළාත් අධ්‍යක්ෂවරයා අදහස් වේ ;

"මහා මාර්ගය" යන්නෙන්, නගර සහා සැලසුම් ප්‍රදේශයක් ඇතුළත හෝ මහා නගර සහා සැලසුම් ප්‍රදේශයක් ඇතුළත පිහිටි වීදි හැර, ජාතික මහා මාර්ගයක් ඇතුලු සාමාන්‍ය මෝටර් වාහන ගමනාගමනය සඳහා අදහස් කරනු ලබන යම් මාර්ගයක් අදහස් වේ ;

"රක්ෂිතයක්" යන්නෙන්, මාර්ගයකට මහා මාර්ගයකට හෝ ජාතික මහා මාර්ගයකට අදාළව මාර්ගයක හෝ මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක ආරක්ෂාව, සුරක්ෂිත බව සහ එහි සුභ සිද්ධිය සඳහා සහ මාර්ගයේ, මහා මාර්ගයේ හෝ ජාතික මහා මාර්ගයේ අනාගත සංවර්ධනය සඳහා වෙන් කරනු ලැබ ඇති මාර්ගයක හෝ මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක කානු හෝ අද්දරවලට යාබදව සහ පිටතින් පිහිටා ඇති තීරු ඉඩම් අදහස් වේ ;

"මාර්ග අයිතිය" යන්නෙන්, මාර්ගයක හෝ මහා මාර්ගයක හෝ ජාතික මහා මාර්ගයක රථවාහන ගමන් ගන්නා කොටස මාර්ග උරහිස අද්දර ඇති කානු සහ රක්ෂිතයක් ඇතුළත් වේ ;

'මාර්ගය'' යන්නට—

(අ) සියලු මාර්ග, මහා මාර්ග හා ජාතික මහා මාර්ගවලට ඉහලින් ඇති පාරවල් මෝස්තු, පාලම්, අත්තර් හුවමාරු, කරත්ත පාරවල් සහ අඩි පාරවල් මෙන්ම ඒවාට අයත් හෝ අදාළ සියලු පාලම්, බැම්, සපත්තු පාලම් සහ අගල් ;

(ආ) යම් පාරක ආරක්ෂාව හෝ සුභ සිද්ධිය උදෙසා වෙන්කර ඇති එම පාරට යාබද සියලු ඉඩම් ;

(ඇ) යම් පාරක් තැනීම සඳහා ලකුණු කර ඇති හෝ වෙන්කර ඇති සියලු ඉඩම් සහ

(ඈ) මාර්ගවල සහ කරත්ත පාරවල මධ්‍යයේ සිට මීටර් දහයක් දුරින් පිහිටියා වූ ද, පෞද්ගලික දේපළක් නොවන්නා වූ ද සියලු මුඩු බිම් සහ ප්‍රසිද්ධ අඩිපාරවල මධ්‍යයේ සිට මීටර් තුනක් දුරින් පිහිටි සියලු මුඩු ඉඩම ; (එම මුඩු ඉඩම් පෞද්ගලික දේපළක් බවට ඔප්පු කිරීමේ භාරය එය ප්‍රකාශ කරන තැනැත්තා සතු විය යුතු ය.)

ඇතුළත් වේ;

''මාර්ග සංවර්ධන අධිකාරිය'' යන්නෙන්, 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබූ මාර්ග සංවර්ධන අධිකාරිය අදහස් වන අතර, ඊට මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවට යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ පිහිටුවනු ලබන හෝ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ගවලට අදාළව දැනට ක්‍රියාත්මක කරනු ලබන බලය පවරනු ලැබිය හැකි යම් අධිකාරියක් හෝ වෙනත් මණ්ඩලයක් ද ඇතුළත් වන බවට සලකනු ලැබිය යුතු ය

'ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග'' යන්නෙන්, භාවිත කරන්නන්ගෙන් ගාස්තුවක් අයකළ හැකි යම් මාර්ගයක්, අධිවේගී මහා මාර්ගයක් හෝ ඉන් කොටසක් අදහස් වේ ,

"වාහනය" යන්නෙන්—

(අ) බයිසිකලයක් හෝ වෙනත් ඇදගෙන යන වාහනයක් ; සහ

(ආ) ට්‍රේලරයක් ඇතුළුව,

පැදගෙන යෑමේ හෝ ඇදගෙන යාමේ අදහසින් එසේ පැදගෙන යාමට හෝ ඇදගෙන යනු ලැබීම සඳහා සැලසුම් කළ වාහනයක් අදහස් වේ;

"වැඩ" යන්නෙන්, සියලු මාර්ග වැඩ අදහස් වන අතර, ඊට—

(අ) යම් ව්‍යුහයක් ඉදි කිරීමට හෝ නිර්මාණය කිරීමට ආශ්‍රිත වැඩ ;

(ආ) නිර්මාණයක් වෙනස් කිරීම හෝ අගලක් කැපීම ;

(ඇ) පොළව කැනීම ;

(ඈ) ඉඩමක් හෝ ව්‍යුහයක් සම්බන්ධයෙන් මැදිහත් වීම,

ඇතුළත් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.